# ශ්‍රීමත් සිද්ධාර්ථ ගෞතම බෝධිසත්ත්ව
# විවරණ සහිත සූවිසි බුද්ධ වංශය



සම්පාදනය

අතිපූජනීය නිකපිටියේ ගුණරතන ස්වාමීන් වහන්සේ

# <u>පෙර වදන</u>

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!**

**දෙවින්ද නාගින්ද නරින්ද පූජිතො**
**මනුස්ස සෙට්ඨෙහි තථෙව පූජිතො,**
**තං වන්දථ පඤ්ජලිකා භවිත්වා**
**බුද්ධො හවෙ කප්ප සතෙහි දුල්ලභෝ'ති**
( දී.නි. මහාපරිනිබ්බාන සූත්ත.)

"දේවේන්ද්‍ර නාගේන්ද්‍ර නරේන්ද්‍රයන් ද විසින් පූජා සත්කාර ලද්දා වූ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් විසින් ද එසේම පූජා සත්කාර ලද්දා වූ ඒ සර්වඥ සම්මා්‍යක් සම්බුද්ධ රාජෝත්තමයාණන් වහන්සේට දොහොත් මුදුන් දී වන්දනා කරත්වා. බුදු රජාණන් වහන්සේ වනාහි මහා කල්ප සිය දහස් ගණනකින් අසංඛ්‍ය ගණනකින් පවා ලොව පහළවීම අතිශයින් දුර්ලභ වන බැවිනි." යනු ගාථාවෙහි අදහසයි.

කොළඹ අරියමග්ග සංවිධානය මගින් වර්ෂයක් පාසා සිදු කෙරෙන අති විශේෂ බුද්ධ පූජා, බුද්ධ වන්දනා, ධර්මදාන, සංඝික පූජාමය මහා පුණ්‍ය කර්මයන් මෙතෙක් අනුරාධපුර මහාසෑය, සෝමාවතී චෛත්‍යය, නාගදීප චෛත්‍යය, මයියංගනය චෛත්‍යය ස්ථානයන්හි ගෞරවාකාරයෙන් සිදුකළ අතර මෙවර බදුල්ලේ මුතියංගණ රාජමහා විහාරස්ථානයේදී **"සූවිසි විවරණ බුද්ධ පූජා"** නමින් පැවැත්වේ.

ධර්ම දාන වශයෙන් **"සූවිසි විවරණ බුද්ධ පූජා"** ගාථා පොතත් මෙම **"ශ්‍රීමත් සිද්ධාර්ථ ගෞතම බෝධිසත්ව විවරණ සහිත සූවිසි බුද්ධ වංශය"** සංග්‍රහ ග්‍රන්ථයත් පිරිනැමේ. මෙම ග්‍රන්තය පින්වත් **නාලක ලංකාසේන** මහත්මයාගේ කාරුණික ආරාධනයෙන් පූජ්‍ය තිකපිටියේ ගුණරතන ස්වාමීන් වහන්සේ විසින් සම්පාදනය කරන ලද්දේ ඉතාමත් ශ්‍රද්ධාවෙනි. සූවිසි බුද්ධ වංශය ගැනත් විවරණ ලත් මහබෝසත් චරිතය ගැනත් දතයුතු වූම කරුණු සියල්ල ඇතුලත් වනසේ අකුරු පෙළ ගෙතී ඇති අයුරු ඉතාමත් ප්‍රසාදනීයයි.

මෙය සම්පාදනය කළ පූජ්‍ය තිකපිටියේ ගුණරතන ස්වාමීන් වහන්සේට ධර්මඥාන, භාවනාඥාන, සතසහශ්‍ර ගුණයෙන් දියුණු, තියුණු වී සදහම් ආලෝකය ලොවට බෙදදීම පිණිස රතනත්‍රයානුභාව බලයෙන් ආයුරාරෝග්‍යාදී ශ්‍රී සම්පත් අභිවර්ධනය වේවා.

අරියමග්ග සංවිධානයේ පින්වත් නාලක ලංකාසේන මහත්මයා ප්‍රධාන පරිත්‍යාගශීලී සැමටත්, කියවා ප්‍රයෝජන ගන්න සැමටත් සූවිසි බුද්ධානු භාවයෙන් දෙලොව සුබසෙත ශාන්ත නිවන් සෙත සුවසේ සාක්ෂාත් වේවා.

"සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා"

මෙයට,
මෙතැති.
නා උයනේ අරියධම්ම ස්ථවිර

# පුණ්‍යානුමෝදනාව

සූවිසි විවරණ සහිත වූ බුද්ධවංශයන් ඇතුලත් මෙම කුඩා දහම් පොත සැකසීමේ කුසලබලයෙන් ද, එම විවරණ දුන් සිව්විසි බුදුරජාණන් වහන්සේලාගේ ආනුභාව බලයෙන්ද, බෝසතාණන්වහන්සේ බුදු බවට නියතව විවරණ ලබමින් පුරණලද බුද්ධකාරක ධර්මයන්ගේ ආනුභාව බලයෙන්දව්‍යවහාර වර්ෂ 2012-04-24 දිනට සැත්තැනුන් වන උපන් දිනය යෙදෙන අති පූජනීය නාඋයනේ සිරි අරියධම්ම ස්වාමින් වහන්සේ නිදුක් වෙත්වා! නීරෝගී වෙත්වා! සුවපත් වෙත්වා! විංශත් ශතවර්ෂාධික කාලයක් නිරුපද්‍රිතව උසස් ලෙස සසුන් පිළිවෙත් සපුරා සුවසේම ලොවුතුරු බුදු බව ලබත්වා.

මෙම දහම් පොත සැකසීමේදී මග පෙන්වමින් උපකාර සැලසූ අති පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද ස්වාමින් වහන්සේට දිවා රෑ දෙකෙහි වෙහෙස නොබලා උපකාර සැලසූ පූජ්‍ය වේරපිටියේ දේවානන්ද ස්වාමින් වහන්සේ ඇතුලු අනිකුත් ස්වාමින් වහන්සේලාටද නාඋයන ආරණ්‍ය වාසී වූද ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම වාසී වූද මහා සංඝරත්නයට සියලු බාධක ජය ගෙන සුවසේම ධර්මාවබෝධය පිණිසම හේතු වේවා. අනිකුත් මහා සඟරුවනටද නිර්වාණාවබෝධය පිණිසම හේතු වේවා.

අති පූජනීය නා උයනේ මහා ස්වාමින් වහන්සේට ආශිර්වාදය පිණිස 2012-04-21, 22 දෙදින මුතියංගන චෛත්‍යය භූමියේදී සූවිසි විවරණ පූජා, අරියවංශ ධර්මදේශනා, සීල භාවනා වැඩසටහන් හා අනිකුත් දාන පරිත්‍යාගාදී මහත් පින්කම් මාලාවක් සිදුකරන අරියමග්ග සංවිධානයේ නාලක මහත්මා ප්‍රධාන සැමටද ඒ සඳහා උපකාර සලසන සැමටද නිදුක් නිරෝගී භාවයෙන් යුතුව සුවසේම සියවස් කලක් දහම් අමා සුව විඳිමින් කුසල ධර්ම සම්පාදනයෙහි යෙදී සුවසේ නිර්වාණාවබෝධය සිදුකර ගැනීමට හේතුවේවා.

ශාසනාරක්ෂක ලෝකපාලක දෙවියන්ටද. හිත අහිත මැදහත් සියලු සත්ත්වයන්ටද සුවසේ නිර්වාණාවබෝධය පිණිසම හේතු වේවා.

උපකාරක අනුග්‍රාහක දායක කාරකාදී සැමටද උසස් වූ යහපත් ප්‍රාර්ථනා සඵලවේවා. නිර්වාණාවබෝධය පිණිසම හේතු වේවා.

**"චිරං තිට්ඨතු සද්ධම්මො"**

සාධු! සාධු!! සාධු!!!

පූජ්‍ය තිකපිටියේ ගුණරතන ස්වාමීන් වහන්සේ
නා උයන ආරණ්‍යය සේනාසනය
පන්සියගම.
2012 අප්‍රේල් මස 21 වැනි දින

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

# ශ්‍රීමත් සිද්ධාර්ථ ගෞතම බෝධිසත්ත්ව විවරණ සහිත සූවිසි බුද්ධ වංශය.

## නිධාන කථාව

සිද්ධාර්ථ ගෞතම ශාක්‍ය මුනීන්ද්‍ර සර්වඥසම්මා සම්බුදුරජාණන් වහන්සේ අනන්ත සත්වයන් සසර කතරින් ගොඩනගාලීමට බෝධිසත්ව ව පෙරුම් පුරණා කල සත් අසංඛ්‍ය කල්ප ලක්ෂයක් සිතින් බුදුබව පතමින් මනෝප්‍රනිධානය ද, නව අසංඛ්‍ය කල්පලක්ෂයක් වචනයෙන් බුදුබව පතමින් වාග්ප්‍රනිධානය ද, සාරාසංඛ්‍යය කල්පලක්ෂයක් මහාප්‍රනිධාන පූර්වක ව දීපංකර සම්මා සම්බුදුරජාණන් වහන්සේ හමුවෙහි අෂ්ඨ ධර්‍මසමෝධානයෙන් යුතුව ප්‍රථම අභිනීහාර පූජා ලබමින් ලොව්තුරා බුදුවීමට නියතව සූවිසි බුදුකෙනෙකුන් හමුවෙහි දී විවරණ ලබා බෝධි සම්භාර පුරා මෙයින් වෂී දෙදහස් පන්සිය නව අනූවකුත් මාස එකොළොසකුත් දින පසළොසකට (2599/11/15) පෙර සියළු සම්බුදුරජාණන් වහන්සේලා සපරිවාර මාරපරාජය කොට බුදුවන බෝධි මණ්ඩලයේ දී බුදුවී වදාළ සේක.

මෙලෙස සිද්ධාර්ථ මහසතාණන් වහන්සේ බුදු වී සත්සති ගෙවා බ්‍රහ්ම ආරාධනයෙන් බරණැස ඉසිපතනාරාමයට වැඩ දම්සක් දෙසා කොණ්ඩඤ්ඤ තෙරුන් ප්‍රධාන අසංඛ්‍යගනන් පිරිස් නිවන් පුරට පමුණුවා පඤ්චවාර්ගික භික්ෂූන් වහන්සේලා ඒහි භික්ෂු භාවයෙන් පැවිදි කරවා යස තෙරුන් ප්‍රධාන

සිව්පනස්දෙනෙකුට ද ධර්මාවබෝධය හා පැවිද්ද ලබා දී උරුවෙල් දනව්ව බලා වඩිනා ගමනේ දී භද්‍ර වාර්ගික කුමරුවන් තිසට ද පැවිද්ද ලබා දී උරුවෙල් දනව්වට වැඩ උරුවේල කාශ්‍යපාදී දහසක් දෙනා ට ප්‍රාතිහාර්ය දක්වා දමනයකොට ඒහි භික්ෂුභාවයෙන් පැවිදිකරවා අරිහත්වයට පමුණුවා රජගහනුවරට වැඩ ධර්ම චක්‍ර වස්වා බිම්බිසාර මහ රජතුමා ප්‍රධාන දොළොස් නහුතයක් දෙනා ධර්මයෙහි පිහිටුවා වේළුවනාරාමය පිළිගෙන එහි වැඩසිටි සේක.

සුද්ධෝදන මහ රජතුමා සිද්ධාර්ථ කුමාරයන් වහන්සේ ලොව්තුරා බුදු වී රජගහ නුවර වැඩ සිටිනා බව අසා භාග්‍යවතුන් වහන්සේ තම නුවරට වැඩමවීමට නවවාරයක දී දහස බැගින් පිරිස් යැවූ නමුත් එම පිරිස් පැවිදි වී රජ අපේක්ෂාව ඉටු නොකළ බැවින් දස වන වාරයෙහි අතිශයින් විස්වාසී වූ බෝසතාණන් වහන්සේ සමග එකදු උපන් කාළුදායි ඇමති දහසක් පිරිවර සමඟ යැවීය. හෙතෙමේ ද පැවිද්දට ද අවසර ලබාගෙන ගොස් භාග්‍යවතුන්වහන්සේ හමුවෙහි පැවිදිව සපිරිවරින් රහත්ව මැදින් පුරපසළොස්වක පෝදා සිතන්නේ " **හේමන්තය ගෙවුනේය. වසන්තය පැමිණියේය. වන ලැහැබ සුපුෂ්පිතය. මාර්ගය පහසුවෙයි. දැන් ඥාති සංග්‍රහය පිණිස පිටත්වීමට භාග්‍යවතුන් වහන්සේ වෙත වැඩ වැඳ නමස්කාර කොට වදරන්නේ "**

**අංගාරිනෝ'දනි දුමා භදන්ථෙ - එලෙසිනො ඡදනං විප්පහාය**

**තෙ අච්චිමන්තො විය භාසයන්ති - සමයො මහාවීර භගීරථානං**

ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස ! ගෙඩි කැමති ගස් අතුවල කොළ හැලී ගින් දැල් සෙයින් බබළ බබළා මලින් පිරී ඇත. මහා වීරයන් වහන්ස, භගීරථයන්ට (ඥාති වර්ගයාට) සංග්‍රහ කිරීමට සුදුසු කාලයයි.

**නාති සීතං නාති උණ්හං - නාති දුබ්භික්ඛ ඡාතකං**

**සද්දලා හරිතා භූමී - එස කාලො මහා මුනී**

අති ශීත ද නොවේ. අති උෂ්ණ ද නොවේ. සා දුක් ද නැත. තෙත්වත් වූ පොළව ද නිල්වත් ය. මහා මුනින්ද්‍රයන් වහන්ස, මේ (ඤාති සංග්‍රහයට)සුදුසු කාලයයි.

මෙසේ වූ සැටක් පමණ ගාථාවන්ගෙන් මාර්ග වර්ණනා සහිතව කුල නගරයට වැඩීම පිණිස ආරාධනා කළ සේක.

භාග්‍යවතුන් වහන්සේ ද සියලු බුදුවරයන් වහන්සේලා විසින් අත් නොහරින ධර්මතාවයක් වන ඤාති සමාගමයේ දී බුද්ධවංශ දේශනාව සඳහා දෙමසක් තුල සැට යොදුන් මග වැඩ වසරක් පිරෙන වෙසක් පුණු පෝහෝද කිඹුල්වත්පුර නුවරට වැඩ ඤාතීන් විසින් සාදවා පූජාකරන ලද නිග්‍රෝධාරාමය පිළිගෙන අංග මගධ දෙරට වැසි දසදහසක් ද කිඹුල්වත්පුර වැසි දසදහසක් දැයි විසිදහසක් රහතන් වහන්සේ පිරිවරා ජාතභූමියට වැඩි සේක.

එකල්හී ශාක්‍යයන් මාන්නාධිකයන් බැවින් බාලයන් ලවා බුදුන් වන්දවා වැඩිහිටියන් නොවැඳ සිටි කල්හී භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ අදහස් දැන මෙසේ සිතු සේක.

"මේ නෑයෝ හිස් මහලු නිසා නොවඳිති. බුදුන් කෙබඳුදැයි නොදනිති. බුදුන් නම් මෙබඳු ය, බුදු බලය නම් මෙබඳුයැයි දැන් මම අහසෙහි සර්වරත්නමය සක්වළ පුරා පැතුරුණු සක්මනක් මවා සිය සෘද්ධි බලයත් බුද්ධබලයත් දක්වමින් ප්‍රාතිහාර්යත් කරමි. එහි සක්මන් ද කරමින් මහා ජනයාගේ අදහස් බලා දහමුත් දෙසමි"යි සිතා අහසට පැන නැඟී මවන ලද රුවන් සක්මනෙහි නිර්මිත බුදුරුවක් ද මවා දසදහසක් ලෝක ධාතුව මවිත කරවමින් යමක ප්‍රාතිහාර්යය දක්වා ඤාතීන් දමනය කොට අසූදහසක් ඤාතීන් සරණ සිල් හි පිහිට වූ සේක.

මෙසේ යමක ප්‍රාතිහාර්යය දක්වන අතරතුර රුවන් සක්මනෙහි සක්මන් කරද්දී සැරියුත් මහරහතන් වහන්සේ රජගහනුවර ගිජුකුළු පව්වෙහි පන්සියයක් රහතුන් වහන්සේ පිරිවරා වැඩසිටින්නේ භාග්‍යවතුන් වහන්සේගේ යමක

ප්‍රාතිහාර්යය දැක සිතන්නේ "මම දැන් භාග්‍යවතුන් වහන්සේ වෙත වැඩ බුදු ගුණ පැවසෙන බුද්ධවංශ දේශනයට ආරාධනා කරන්නෙම් නම් යෙහෙකැයි යැයි" සපිරිවරින් අහසින් වැඩ භාග්‍යවතුන් වහන්සේ වැඳ කරන ලද ආරාධනයෙන් සිව්විසි බුද්ධවංශ දේශනාව කළ සේක. ඒ අනුව දීපංකර භාග්‍යවතුන් වහන්සේගේ පටන් කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ දක්වා වූ සූවිසි බුදුවරයන් වහන්සේලාගේ බුදු සිරිත,දම්සක් කථාව, පහළ වූ කල්ප ජාති ගෝත්‍රාදිය, ආයුෂය, බෝධි වෘක්ෂය, අග්‍ර ශ්‍රාවකශ්‍රාවිකාවෝ, උපස්ථායක, මව්පියන්, පුත්‍ර ධාරාවන්, උපන් නගරය, අභිනිෂ්ක්‍රමණය කළ යානය, ශරීර ප්‍රමාණය ගිහිව විසූකාලය හා තමන් වහන්සේ බෝසත්ව එම බුදුවරයන් වහන්සේලාගෙන් විවරණ ලැබීම යන කරුණු ඇතුලත්ව බුද්ධ වංශ දේශනය යමක ප්‍රාතිහාර්යය මධ්‍යයයෙහි පොකුරු වැසි වසිද්දී වදාළ සේක.

මෙම භද්‍ර කල්පයට සාර අසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර අමරවතී නුවර බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද සුන්දර පඬුවක් ඇත්තේය යනාදීයෙන් සුමේධ නම් බ්‍රාහ්මණ පණ්ඩිතව පරපුරෙන් තමන් අයත් වූ මහත් ධන වස්තු රාශිය ගබඩා විවරකොට නගරවාසීන්ට දන් දී ගිහි සාටකයන් හි දොස් නවයක් දැක, සිව්රු දැරීමෙහි ආනිශංස දොළොසක් දැක, ගිහි ඇඳුම් ඉවත් කොට චීවරධාරීව පැවිදිව බොහෝ සෙයින් බෝසත්වරු ඍෂි පැවිද්දෙන් පැවිදි ව අභිඥා ලාභීව මහණදම් පුරණ බැවින් ධම්මික නම් පර්වතයෙහි සක් දෙවිඳුගේ අනින් විස්කම් දෙව් පුත් මවන ලද සක්මන් කුටි වැසිකිළි ආදියෙන් යුත් ආශ්‍රමයෙහි වැස දිනක් අළුයම නැගිට සිතන්නේ **"මම වනාහී දෙව් විමනක් බඳු වූ සියලු සැප ඇති මාළිගා ධන වස්තූන් අත්හැර පැවිදිවූවෙමි. දැන් ආශ්‍රමයෙහි ම විසුම දෙනවනි ගෘහ වාසයක් වැනිය"යි"** කල්පනා කොට ආශ්‍රමයෙහි ආදීනව අටක් දැක එය අතහැර දමා රුක්මුල්හි ආනිශංස දසයක් දැක රුක් මුලකට එළඹ වාසය කරන්නේ මෙසේ සිතීය.

"අහර පිණිස යන එන මට ආහාර සෙවීම දුකකි. මම ආහාර පිණිස මහණවූයේ නොවෙමි. මම වසන තැනට වැටුණු ගෙඩි අනුභව කොට යැපෙමි."

පවත්තඵල සන්තුට්ඨො - අපරායත්ත ජීවිකො
පහීනාහාර ලොලුප්පො - හොති චාතුද්දසො මුනි.

තමා ඉදිරියට වැටුණු ගෙඩියෙන් සතුටුවන, අනුන් අයත් ජීවිකාවක් නැති, හිත කැමති ආහාරයෙහි ලොල් බව ප්‍රහීණ කළ මුණිවරයා සතර දිශාවෙන් කවර දිශාවකට ද ( යැමට ) සුදුස්සෙක් වේ. (ඔහුට) සිව් දිසාවම අයත් වෙයි. රස තණ්හාවද හැර දමයි. ඔහුගේ ආජීවය ද පිරිසිදුය. එබැවින් පවත්තඵල භෝජනය නොයික්මවන්නේය.

මෙසේ වසන සුමෙධ පණ්ඩිතයන් වහන්සේ නොබෝ දිනකින් ම පඤ්ච අභිඥා අෂ්ඨසමාපත්ති ඉපදවූහ.

## 1. දීපංකර බුද්ධ වංශය

මනුෂ්‍ය ආයුෂය වර්ෂ ලක්ෂයක් ව පැවති මෙම කාලයෙහි සමත්‍රිංශත්පාරමී පුරා දෙව්බඹුන්ගේ ඇරයුමෙන් රම්මක නම් නුවර සුදේව රජතුමාගේ සුමේධා දේවිය කුස පිළිසිඳ දස මසක් ගිය කළ මවු කුසින් බිහිව හංසා, කොඤ්චා, මයුරාබ්‍යා, යන තුන්පහයෙහි පදුමා දේවිය ප්‍රධාන ලක්ෂයක් බිසෝවරුන් සමඟ අවුරුදු දසදහසක් ගිහිව වැස සතර පෙර නිමිති දැක පදුමා දේවියට උසභක්ඛන්ධ පුත්‍රයා උපන් දින පැවිදි වීමට සිතූ විට බ්‍රහ්මරාජයෙකු ගෙනවිත් දුන් අටපිරිකර ධාරීව පැවිදිව එක්ව පැවිදි වූ කෝටියක් දෙනා පිරිවරාගෙන දසමසක් දුෂකරක්‍රියා කොට වෙසක් පෝද පිඩු පිණිස නුවරක හැසිර නුවර වාසීහු දෙවියන්ට බලි පිණිස පැන් නුමුසුව සැකසූ කිරිබතක් පූජා කළ විට එය සියල්ලන් සමඟ වළඳ සල් උයනෙහි වැස සවස පිරිසෙන් වෙන්ව සුනන්ද ආජීවකතුමා දුන් කුස තණ අට මිට

රැගෙන පලොල් බෝධිය වෙත පැමිණ තෘණ ඇතිරිය අතුරා එකෙනෙහි ම පැණ නැඟි පණස්තුන් රියන් වජිරාසනයෙහි වීර්‍ය්‍යා අධිෂ්ඨානයෙන් හිඳ බුදු වූ සේක.

සත්සතිය බෝධි සමීපයෙහි ගෙවා බ්‍රහ්මාරාධනාවෙන් සුනන්දාරාමයෙහි ධම්සක් පවත්වා කෝටි සියයක් දෙනා මාර්ග ඵලයන්ට පමුණුවාලූහ.

## ශ්‍රාවක සන්නිපාත.

1. භික්ෂුහු කෝටි ලක්ෂයකි. 2. භික්ෂූහු කෝටි සියයකි.
3. භික්ෂූහු කෝටි නවදහසකි.

එම මංගල අවස්ථාවන්හි වූ පෘථුවිකම්පාදිය සමවත් සුවයෙන් සිටි සුමේධ තාපසයන්ට නොදැනුනේය.

## අෂ්ඨ ධර්‍ම සමෝධානයෙන් යුතුව ප්‍රථම නියතවිවරණය ලැබීම. (අභිනීහාරය)

දීපංකර භාග්‍යවතුන් වහන්සේ සාරලක්ෂයක් රහතුන් පිරිවරා චාරිකා කරන්නේ රම්මක නගරයට වැඩ සුදර්ශන මහ විහාරයෙහි වැඩ වසනසේක. නුවර වාසීහූ තෙල් මල් ආදිය ගෙන ගොස් බුදුන් පුද බණ අසා පැහැද පසුදින භාග්‍යවතුන් වහන්සේට දනයට ආරාධනා කොට ගියහ. පසුද භාග්‍යවතුන්වහන්සේට වඩින මාර්ගය සකසමින් සිටින නුවර වාසීහූ වෙත සෘද්ධිබලයෙන් අහසින් යමින් සිටි සුමේධ තාපසයන් පැමිණ කාරණය විමසා බුදුන් ලොව පහළ වූහයි අසා මටත් පිළිසකර කිරීමට ටිකක් දෙව් යැයි ඉතිරිව තිබූ මඩසහිත කොටසක් ගෙන සකසනාතුර සාරලක්ෂයක් රහතුන් පිරිවරා වඩනා බුදුන් දුටු සුමේධ පණ්ඩිත තෙමේ මඩ වගුරු සහිත එම බිම භාග්‍යවතුන් වහන්සේ දෙසට මුනින් හෙව බිම දිගා වී ජීවිත පරිත්‍යාග කරමියි සිතා "මඩ නොමැඩ මාගේ ශරීරය ඒ දණ්ඩක් කොට සාරලක්ෂයක් රහතුන් වහන්සේ

සමග වඩින සේක්වා. එය මට බොහෝ කලක් හිත පිණිස වන්නේය යි ආරාධනාකොට සිටියේය. මේ වනවිට සොළොස් අසංඛ්‍යකල්ප ලක්ෂයක් පිරූ පාරමී ඇති බෝසතාණන් වහන්සේ නියත විවරණ ලැබීමට සුදුසුකම් වලින් පරිපූර්ණව සිටියේය. එනම් :-

**මනුස්සත්තං ලිංගසම්පත්ති - හෙතු සත්ථාර දස්සනං**
**පබ්බජ්ජා ගුණසම්පත්ති - අධිකාරො ච ඡන්දතා**
**අට්ඨ ධම්ම සමොධානා - අභිනීහාරො සමිජ්ඣති.**

1. මනුස්සත්තං:-මනුෂ්‍යයෙකුව ඉපිද සිටීම. නාගාදී සත්වයන්ව සිටියවුන්ට ප්‍රථම අභිනීහාරය(විවරණ ලැබීම) සිදු නොවේ. රහත්වීමට නොලැබෙන බැවින් අහේතුකයන්ට ප්‍රථම විවරණය නොලැබේ.

2. ලිංගසම්පත්ති:-පුරුෂකුවම සිටිය යුතුය. ස්ත්‍රී පණ්ඩක නපුංසක උභතොබ්‍යඤ්ජනකයන්ට සඵල නොවේ. ලක්ෂණ පරිපූර්ණ නොවන බැවිනි.

3. හෙතු:- ඒ දිවියේදීම උද්ඝටිතඥ විපඤ්චිතඥ ඤෙය්‍ය වශයෙන් රහත් බවට හේතු පරිපූර්ණයෙකුම විය යුතුය.අනෙකෙකුට නොවෙයි.රහත් ඵලය ලබන්නකුම බුදුවන බැවිනි.

4. සත්ථාරදස්සනං:-ජීවමාන බුදු කෙනෙකුන් හමුවෙහි ප්‍රාර්ථනා කරන්නකුටම සඵල වෙයි. බුදුන් පිරිනිවී පසු චෛත්‍යය බෝධි ප්‍රතිමා ලඟ හෝ පසේ බුදු රහත්හු ලඟ කරන ප්‍රාර්ථනාව සමෘද්ධ නොවේ. භව්‍ය අභව්‍යයන් දැන කර්ම විපාක පිරිසිඳ දන්නා නුවණින් පිරිසිඳ ප්‍රකාශ කිරීමට අසමත් බැවිනි.

5. පබ්බජ්ජා:- බුදුන් හමුවේ පතන්නේ ද කර්ම වාදී ක්‍රියා වාදී ව හෝ බුදු සසුනෙහි පැවිදිව පතන්නහුටම සඵල වෙයි. ගිහිව සිටියහුට නොවේ. පැවිදි වූ බෝසතුන් ම බුදුවන බැවිනි.
6. ගුණසම්පත්ති:- පඤ්ච අභිඥා අෂ්ඨ සමාපත්ති ලාභීහුටම සඵල වේ. එම ගුණ නැතියහුට නොවේ. එම ගුණ ලාභීවමම බුදුවන බැවිනි.
7. අධිකාරෝ:- ගුණ සම්පන්න වුව ද ජීවිතය බුදුන්ට පුදන්නහුට ම ප්‍රාර්ථනාව සමෘද්ධ වේ. නැතියහුට නොවයි.
8. ඡන්දතා:- "සක්වල එකම ජලාශයක් නම් බාහු බලයෙන් යොදුන් දොළොස් ලක්ෂ තුන්දහස් හාරසිය පණසක් (1203450) විෂ්කම්භය ඇති එම ජලාශයෙන් පිහිනා එතෙර වීමට හැකියහුට ම බුදුවිය හැකිය. නොහැක්කෙකුට නොවේ" යැයි කියන්නේ නම් සත්ත්වයන් සසර දුකින් එතර කරවනු වස් එයට ද කැමති වෙයි.

අවීචි නරකයෙහි මුළු පාරමී කාලයම( සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂය) ගිනි දැල් වලින් වෙළී දුක් විඳින්නහුට ම බුදු විය හැකියැයි කියන්නේ නම් සත්ත්වයන් වෙනුවෙන් එයට ද කැමති වෙයි. ඒ තරම් අදහස් ඇත්තහුට ම බුදුවිය හැක.

මේ කරුණු අටෙන් සුදුසු කම් ඇතිව දීපංකර භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී

**පස්සථ ඉමං තාපසං - ජටිලං උග්ග තාපනං**
**අපරිමෙය්‍ය ඉතො කප්පේ - බුද්ධො ලොකෙ භවිස්සති.**

යනුවෙන් මහණෙනි, ඔබලා මේ මඩෙහි වැතිර දිවි පුදා උග්‍ර තපස් ඇතිව සිටිනා මේ තාපස තුමා දක්නහු ද මේ තෙමේ බුදුබව ප්‍රාර්ථනා කොට මෙසේ කරයි. මොහුගේ ප්‍රාර්ථනය ඒකාන්තයෙන් සමෘද්ධ වේ යැයි වදාළහ.

මෙම තාපස තෙමේ මෙයින් සාරාසංඛෙය්‍ය කල්පලක්ෂයක් ගිය තැන භද්‍ර කල්පයෙහි ගෞතම නමින් බුදුව අසංඛෙය්‍ය ගනන් සත්ත්වයන් නිවන් පුර පමුණුවාලති. එම ආත්මභාවයේ දී කපිල වස්තු නුවර සුද්ධෝදන පිය රජුගේ මහා මායා නම් මහේශිකාව කුස පිළිසිඳ දස මස් ඇවෑමෙන් ලුම්බිණි උයනේ දී බිහිව යශෝධරා මහේශිකාව ප්‍රධාන සොළොස් දහසක් නාටක ස්ත්‍රීන් සමඟ අවුරුදු විසිනවයක් (29) ගිහිව වැස සතර පෙර නිමිති දැක යශෝධරා දේවියට රාහුල කුමරු උපන් දින කන්ථක නම් අසු පිට නැඟ අභිනිෂ්ක්‍රමණය කොට සය වසරක් දුෂ්කරක්‍රියා කොට සේනානි නිගම සුජාතා නම් සේනානි සිටුදියණිය දෙන කිරිපිඩු වළඳ සොත්ථිය නම් බ්‍රාහ්මණයා දෙන කුසතණ ගෙන ඇසතු බෝ මුලට ගොස් තෘණ අතුරා තුදුස් රියන් වජ්‍රාසණාරූඪව බුදුවන්නේ ය. බරණැස ඉසිපතනයට වැඩ දම්සක් දෙසා තමන් වෙනුවෙන් පැවිදි වූ පස්වග මහණුන් වහන්සේ සොවාන් ඵලයෙහි පිහිටුවා අසංඛ්‍ය ගණන් සත්ත්වයන් නිවන් දක්වන්නේ ය. වේළුවනාරාමයෙහි එක්දහස් දෙසිය පණසක් භික්ෂූන්ගෙන් වන එකම ශ්‍රාවක සන්නිපාතය වන්නේය. සැරියුත් මුගලන් නම් අග්‍රශ්‍රාවක දෙනමක් වෙති. ආනන්ද නම් උපස්ථායක කෙනෙක් වෙයි. ඛේමා උප්පලවණ්ණා අග්‍රශ්‍රාවිකාවෝ වෙති. ඇසතු රුක බෝධියයි. අටළොස්රියන් ශරීරය වෙයි. ශරීරප්‍රභාව බඹයෙකි. ආයුෂය වර්ෂ සියයකි. දේවිය යශෝධරාවයි. පුත්‍රයා රාහුල නම් වෙයි. උපස්ථායක රජු බිම්බිසාර නම් වේ. ජේතවනාරාමය නිත්‍ය වාසස්ථානය වෙයි. කුසිනාරාවෙහි දී පිරිණිවෙයි. ධාතුහු විසිරෙයි. යනාදී ලෙස විවරණ දී වදාළ සේක.

දීපංකර බුදුන්ගේ උපන් නගරය රම්මක නම් වෙයි. සුදේව රජු පියාය. මව සුමේධා බිසවය. සුමංගල තිස්ස අග්‍රශ්‍රාවකයෝ වූහ. සාගත උපස්ථායකය. නන්ද සුනන්ද අග්‍රශ්‍රාවිකාවෝ ය. පුළිල රුක බෝධියය. උසභක්ඛන්ධ පුත්‍රයාය.

ඇත් යානයෙන් අභිනිෂ්ක්‍රමණය විය. නන්දරාමයෙහි නිත්‍ය වාසය විය.

---

දීපංකර බුදුරජාණන් වහන්සේගේ සසුන ගෙවී එම සාරමණ්ඩ කල්පයෙන් පසු බුද්ධ ශූන්‍යව කල්ප අසංඛෙය්‍යක් ගෙවී ගියේය. එයින් පසු සාර නම් කල්පයෙහි කොණ්ඩඤ්ඤ භාග්‍යවතුන්වහන්සේ ලොව පහල වූහ.

## 2. කොණ්ඩඤ්ඤ බුද්ධ වංශය

මිනිස් ලොව ආයුෂය අවුරුදු ලක්‍ෂයක්ව පැවති කල රම්‍යවතී නුවර සුනන්ද රජුගේ සුජාතා නම් මහේසිකාව කුස පිළිසිඳ දසමසකින් බිහිවිය. කොණ්ඩඤ්ඤ ගෝත්‍රයෙහි උපන් බැවින් කොණ්ඩඤ්ඤ නම් විය. රාම, සුරාම, සුභ මාලිගා තුනෙහි තුන්ලක්‍ෂයක් ස්ත්‍රීන්ට ප්‍රධාන රුචිදේවී නම් මහේසිකාව සමග දස දහසක් අවුරුදු ගිහිව වැස සතර පෙර නිමිති දැක විජිතසේන පුත්‍රයා උපන් දින අජානීය රථයෙන් අභිනිෂ්ක්‍රමණය කොට දස කොටියක් දෙනා සමග පැවිදිව දස මසක් ප්‍රධන් වීර්‍ය්‍ය වඩා වෙසක් පොහෝ දින සුනන්ද ගම යසෝධරා නම් සිටු දියණිය පිදූ කිරිපිඩු වළඳ සල් වනයෙහි වැස සවස සුනන්ද ආජීවකයන් දුන් කුස තණ ගෙන සාල කල්‍යාණී බෝධිය වෙත පැමින තෙවරක් පැදකුණු කොට තෘණ අතුරා අට පණස් රියන් වජ්‍රාසනයෙහි වැඩහිද බුදු වූ සේක.

සත් සති ගෙවා දේවාරාධනා ඇතිව අමරවතී නුවර දේව වනයට අහසින් වැඩ එක්ව පැවිදි වූ දස කෝටියක් දෙනාට සම්සක් දෙසීමෙන් කෝටි ලක්‍ෂයක් දෙනාට ධර්මාවබෝධය වූහ.

## ශ්‍රාවක සන්නිපාත

01. භික්ෂූහු කෝටි ලක්ෂයකි. 02 භික්ෂූහු කෝටි ලක්ෂයකි. 03 භික්ෂූහු අසූ කෝටියකි.

## දෙවන විවරණය ලැබීම

එකල බෝසතාණෝ චන්දවතී නුවර විජිතාවී නම් සක්විති රජව වසන්නේ භාග්‍යවතුන් වහන්සේ කෝටි ලක්ෂයක් භික්ෂූන් පිරිවරා එම නුවරට වැඩි සේක. එය දත් බෝසතාණෝ සතුටුව ගොස් ආරාධනා කොට පසුදා මහත් දානයක් දී බණ අසා පැහැදී නැවත තෙමසක් දන් දුන්හ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙතෙමේ තුන් අසංඛ්‍යෙය කල්ප ලක්ෂයකින් මතු බුදු වන්නේ යැයි විවරණ දුන්සේක. බෝසතාණෝ සතුටුව සක්විති රාජ්‍ය අත්හැර පැවිදිව පිටකත්‍රය ඉගෙන අෂ්ඨ සමාපත්ති පඤ්චාභිඥා උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන් බඹලොව ගියහ.

කොණ්ඩඤ්ඤ බුදුන් උපන් නගරය රම්‍යවතී නම්ය. සුනන්ද ක්ෂත්‍රිය රජු පියාය. සුජාතා දේවිය මවය. භද්‍ර, සුභද්‍ර, දෙනම අග්‍ර ශ්‍රාවක වූහ. අනුරුද්ධ උපස්ථායකය. තිස්සා, උපතිස්සා අග්‍ර ශ්‍රාවිකාවෝය. බෝරුක සාලකල්‍යාණිය. ශරීරය අටාසූරියන්ය. ආයුෂය අවුරුදු ලක්ෂයකි. මහේශිකාව රුචිදේවියය. පුත්‍රයා විජිතසේනය. චන්ද උපස්ථායක රජුය. චන්දරාමය නිත්‍ය වාසස්ථානය විය. එහිදි ම පිරිනිවුනේය. ඒක ඝණවූ ධාතුහු රන් පිළිමයක් මෙන් පැවතියේය. දඹදිව් වැසියන් එක්ව සත් යොදුන් වූ සප්ත රත්නමය චෛත්‍යයක ධාතුහු නිධන් කළහ.

---

කොණ්ඩඤ්ඤ භාග්‍යවතුන් වහන්සේගෙන් පසු කල්ප අසංඛ්‍යයක් බුද්ධ ශුන්‍යව ගොස් එක් කල්පයක මංගල, සුමන, රේවත, සෝභිත බුදු රජාණන් වහන්සේලා සතර නමක් පහළ වූ බැවින් සාර මණ්ඩ කල්පය නම් විය.

## 3. මංගල බුද්ධ වංශය.

මංගල බෝසතුන් සොළසාසංඛ්‍යය කල්ප ලක්ෂයක් පිරූ පාරමී ඇතිව උත්තර නුවර උත්තර රජතුමාගේ උත්තරා දේවිය කුස පිළිසිඳ ගත්තේය. එතැන් පටන් අසූ රියනක් තැන ඉරහඳ පරදවන ආලෝකයක් පැවතියේය. බෝසතාණෝ උත්තර මධුර උයනේදී උපන්නේය. උපන් මොහොතේදේ සියලු මංගල සම්පත් හටගත් බැවින් මංගල යැයි නම් තැබීය. යසවා, සුචිමා, සිරිමා යන තුන් පහයෙහි තිස් දහසකට ප්‍රධාන වූ යසවති දේවිය සමග නවදහසක් අවුරුදු ගිහිව වැස පෙරනිමිති දැක සීලව කුමරු උපන් ද පණ්ඩර අසු පිටින් අභිනිෂ්ක්‍රමණය කොට තුන් කෝටියක් දෙනා දමග පැවිදිව අටමසක් දුෂ්කර ක්‍රියා කොට වෙසක් පෝද උත්තර ගම උත්තර සිටුහුගේ උත්තරා දියණිය දුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ සල් වනයෙහි වැස සවස උත්තර ආජීවකයන් දුන් තෘණ ගෙන නා බෝධිය වෙත පැමිණ තෘණ අතුරා අටපණස් රියන් වජ්‍රාසනයෙහි වැඩහිද බුදු වූ සේක. සත්සති ගෙවා බ්‍රහ්මාරාධනයෙන් සිරි වනයට අහසින් වැඩ එක්ව පැවිදිවූ තුන් කෝටියක් භික්ෂූන්ට සම්සක් දෙසිමෙන් සියලු දෙනා වහන්සේම රහත්වූහ. අසංඛ්‍යය ගණන් දෙව්මිනිසුන් නිවන් දුටහ.

### ශ්‍රාවක සන්නිපාත.

01 භික්ෂූහු නව කෝටියකි. 02 භික්ෂූහු කෝටි ලක්ෂයකි. 03 භික්ෂූහු අනූ කෝටියකි.

**නෙවන විවරණය ලැබීම.**

එකල බෝසතාණන් වහන්සේ සුරුචි බමුණු ගම සුරුචි බ්‍රාහ්මණව ත්‍රිවේද ප්‍රාප්තව බුදුන් වෙත ගොස් බණ අසා සරණ සිල්හි පිහිටා දනට ආරාධනා කොට ලක්ෂයක් භික්ෂූන් පිරිවැරූ භාග්‍යවතුන් වහන්සේට සක්දෙවිදු මවා දුන් දොළොසේයාදුන් සත් රුවන් මණ්ඩපයේදී සතියක් දන් දී බෙහෙත් පිණිස ගිතෙල්, වෙඬරු, මීපැණි පුදා තුන් සිවුරුද පූජා කළේය. භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනා දහම් දෙසමින් මෙයින් දෙයාසංඛ්‍යය කල්ප ලක්ෂයකින් මතු ගෞතම නමින් බුදු වන්නේ යැයි විවරණ දුන් සේක.

මංගල බුදුන් උපන් නුවර උත්තරය. උත්තර රජු පියාය. උත්තරා දේවිය මවය. සුදේව, ධර්මසේන අග්‍රශ්‍රාවක වූහ. පාලිත උපස්ථායකය. සීලවා, අශෝකා අග්‍රශ්‍රාවිකාවෝය. නා බෝධියය. අස්යානයෙන් අභිනිෂ්ක්‍රමණය විය. ශරීරය අටාසූරියන්ය. ආයුෂය අවුරුදු අනූදහසකි. භාර්යාව යසවතීය. සීලව පුත්‍රයාය. උත්තරාරාමය නිත්‍ය වාසස්ථානය විය. මංගල භාග්‍යවතුන්ගේ ශරීරප්‍රභාව දසදහසක් සක්වල එක පැහැර පැවතුනේය. පිරිනිවන් පෑ දිනයෙහි දසදහසක් සක්වල අන්ධකාර විය. දසදහසක් සක්වල දෙව්මිනිසුන් හඬා වැළපුනහ.

-------------------------

## 4. සුමන බුද්ධ වංශය.

එම කල්පයෙහිම දෙවන අන්තර් කල්පයෙහි ආයුෂය අනූ දහසක් පැවති කළ අටාසංඛ්‍යය කල්ප ලක්ෂයක් පිරූ පාරමී

ඇති සුමන බෝසතුන් මේබල නුවර සුදත්ත රජ කුලයෙහි සිරිමා මෙහෙසිය කුස පිළිසිඳ දස මස් ඇවෑමෙන් ඉපිද නාරිවර්ධන, සෝමවර්ධන, ඍද්ධිවර්ධන ප්‍රාසාද තුනෙහි නව දහසක් අවුරුදු වටංසිකා දේවිය ප්‍රධාන හැටතුන් දහසක් ස්ත්‍රීන් සමග ගිහිව වැස සතර පෙර නිමිති දැක අනුපම කුමරු උපන් දින අත් යානයෙන් අභිනිෂ්ක්‍රමණය කොට තිස් කෝටියක් දෙනා සමග පැවිදිව දස මසක් ප්‍රධන් වීර්යය වඩා වෙසක් පෝද අනෝමා නියම් ගම අනුපම සිටු දියණිය වූ අනුපමාව දුන් ක්ෂීරපායාසය වළදා සල්වනයෙහි වැස සවස අනුපම ආජීවකයන් දුන් තෘණ අටමිට ගෙන නා බෝධිය වෙත පැමිණ තෘණ අතුරා තිස් රියන් ආසනයෙහි වැඩ හිඳ බුදුවූ සේක

සත්සති ගෙවා දේවාරාධනා ඇතිව මේබල උයනට අහසින් වැඩ එක්ව පැවිදිවූ තිස්කෝටියක් දෙනාටද සරණ හා භාවිත කුමරුවන් ප්‍රධාන පිරිසටද දම්සක් දෙසීමෙන් සියල්ලන්ටම ධර්මාභිසමය වූහ.

ශ්‍රාවක සන්නිපාත

1. භික්ෂූහු කෝටි ලක්ෂයකි,2. භික්ෂූහු කෝටි අනූදහසකි, 3. භික්ෂූහු කෝටි අසූදහසකි.

## සිවුවැනි විවරණය ලැබීම

එකල බෝසතාණෝ ඍද්ධි ආනුභාව ඇති අතුල නම් නා රජව සිට බුදුන් උපන් බව අසා සපිරිවෙරින් ගොස් දිව්‍ය තූර්ය නාදයෙන් උපහාර දක්වා මහා දන් දී තුන් සිවුරු ද පූජා කලහ. භාග්‍යවතුන් වහන්සේ අනුමෙවෙනි බණ වදරමින් මෙයින් දෙයාසංඛ්‍යය කල්ප ලක්‍ෂයකින් මතු ගෞතම නමින් බුදු වන්නේ යැයි විවරණ දුන් සේක.

සුමන භාග්‍යවතුන් වහන්සේ උපන් නගරය මේඛලය. පියා සුදත්තය. මව සිරිමාය. සරණ, භාවිතත්ත අග්‍ර ශ්‍රාවක වූහ. උදේන උපස්ථායකය. සෝණා උපසෝණා අග්‍ර ශ්‍රාවිකාවෝය. නා බෝධියය. ශරීරය අනූරියන්ය. ආයුෂය අවුරුදු අනූදහසකි. මහේසිකාව වටංසිකාය. අනූපම පුත්‍රයාය. අභිනිෂ්ක්‍රමණය ඇත් යානයෙන් විය. උපස්ථායක අංග රජතුමාය. අංගාරාමයෙහි නිත්‍ය වාසය විය.

--------------------------

## 5. රේවත බුද්ධ වංශය.

එම කල්පයෙහිම තෙවන අන්තර් කල්පයෙහි හැටදහසක් මිනිස්ලොව ආයුෂ ඇතිවිට සුධඤ්ඤවතී නුවර විපුල රජුගේ විපුලා මෙහෙසිය කුස අට අසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයක් පුරන ලද පාරමි ඇති රේවත බෝසතුන් පිළිසිඳ උපත ලබා සුදස්සන, රතනග්ගි, ආවේල යන ප්‍රාසාද තුනෙහි තිස්තුන්දහසක් ස්ත්‍රීන්ට ප්‍රධාන වූ සුදස්සනා දේවිය සමග අවුරුදු හයදහසක් ගිහිව වැස සතර පෙරනිමිති දැක වරුණ නම් පුත්‍රයා උපන්දින ආජඤ්ඤ රථයෙන් අභිනිෂ්ක්‍රමනය කොට කෝටියක්දෙනා සමග පැවිදිව සත්මසක් දුෂ්කර ක්‍රියා කොට ප්‍රධන් විර්යය වඩා වෙසක් පොහෝද සාධු නම් සිටු දියණය දුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳා දිවා විහරනය සල් වනයෙහි ගතකොට සවස වරුණින්ධර ආජීවකයන් දුන් තෘණ අටමිට ගෙන නා බෝධිය වෙත පැමිණ අතුරා පණස්තුන්රියන් ආසනයෙහි වැඩහඳ බුදු වූ සේක.

සත්සති ගෙවා බ්‍රහ්මාරාධනයෙන් වරුණාරාමයට අහසින් වැඩ සම්සක් දෙසිමෙන් එක්ව පැවිදි වූ කෝටියක් දෙනා රහත් වූහ. යට මගඵල ලැබූවන් ගනන් නැත.

## ශ්‍රාවක සන්නිපාත.

01 භික්ෂූහු ගණන් නියමයක් නැත. 02 භික්ෂූහු කෝටි ලක්ෂයකි. 02 භික්ෂූහු කෝටි ලක්ෂයකි.

## පස්වන විවරණය ලැබීම

එකල බෝසතාණෝ රම්‍යවතී නුවර අතිදේව නම් බ්‍රාහ්මණව ත්‍රිවේදප්‍රාප්තව රේවත බුදුන් දැක බණ අසා සරණසිල්හි පිහිටා භාග්‍යවතුන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයන්හි පැහැද දහසක් අගනා උතුරු සළුවෙන් පූජා කලේය. එහිදි භාග්‍යවතුන් වහන්සේ මෙතෙමේ මෙයින් දෙයාසංඛ්‍යය කල්ප ලක්ෂයකින් මතු ගෞතම නමින් බුදු වන්නේ යැයි විවරණ දුන් සේක.

රේවත බුදුරදුන් උපන් නගරය සුධඤ්ඤවතීය. විපුල ක්ෂත්‍රිය තෙමේ පියාය. මව විපුලාය. වරුණ, බ්‍රහ්මදේව අග්‍ර ශ්‍රාවකයෝ වූහ. සම්භව උපස්ථායකය. භද්‍රා, සුභද්‍රා අග්‍ර ශ්‍රාවිකාවෝය. නා බෝධියය. ශරීරය අසුරියන්ය. ආයුෂය අවුරුදු අසූදහසකි. සුදර්ශනා අගමෙහෙසියයි. වරුණ පුත්‍රයාය. ආජඤ්ඤ රථයෙන් අභිනිෂ්ක්‍රමණය විය. ශරිරප්‍රභාව හාත්පස යොදුනකි.

---------------------------

## <u>6. සෝභිත බුද්ධ වංශය</u>

එම කල්පයෙහිම සතරවන අන්තර් කල්පයෙහි සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරන ලද පාරමී ඇතිව සෝභිත බෝසතුන් සුධම්ම නුවර සුධම්ම රජුගේ සුධම්මා මෙහෙසිය කුස පිළිසිඳ සුධම්ම උයනේදි බිහිව කුමුද, කලීර, පදුම ප්‍රාසාදයන්හි

සැත්තෑදහසක් කන්‍යාවන්ට නායක වූ මබිලා දේවිය සමග දසදහසක් අවුරුදු ගිහිව වැස සතර පෙරනිමිති දැක සීහ නම් පුත්‍රයා උපන් දින මාළිගයේදීම පැවිදිව ආනාපාන සතිය වඩා ධ්‍යාන උපදවා සත්දිනක් එහිදීම දුෂ්කරක්‍රියා කොට වෙසක් පොහෝද මබිලා මහේශිකාව දුන් මීපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ අභිනිෂ්ක්‍රමණයට සිතත්ම ප්‍රාසාදය පිටින්ම සපිරිවරින් අහසින් ගොස් නා බෝධිය මැදිකොට භූමියෙහි පිහිටි කල්හි බෝසතුන්ගේ අධිෂ්ඨානයෙන් ස්ත්‍රීන් මාලිගයෙන් බැසගිය කල්හි ධර්මතාවයෙන් අන් අයද වෙන්ව ගොස් හිස් වූ මාළිගයේදී එකලාවම බුදු වූ සේක.

## ශ්‍රාවක සන්නිපාත

01 භික්ෂූහු කෝටි සියයකි. 02 භික්ෂූහු අනූකෝටියකි. 03 භික්ෂූහු අසූකෝටියකි.

## සයවන විවරණය ලැබීම.

එකල බෝසතාණෝ සුජාත නම් බ්‍රාහ්මණව සෝභිත භාග්‍යවතුන් වහන්සේගෙන් බණ අසා සරණ සීලයෙහි පිහිටා මහා දන් දුන්නේය. භාග්‍යවතුන් වහන්සේද මෙතෙමේ මෙයින් දෙයාසංඛ්‍යය කල්ප ලක්‍ෂයකින් මතු ගෞතම නමින් බුදු වන්නේ යැයි විවරණ දුන් සේක.

සෝභිත බුදුන්ගේ උපන් නගරය සුධම්මය. අසම, සුනේත්‍ර අග්‍රශාවකයෝ වූහ. අනෝම උපස්ථායකය. නකුලා, සුජාතා අග්‍රශ්‍රාවිකාවෝය. නා බෝධිවෘක්ෂයයි. ශරීරය අටපණස් රියනකි. ආයුෂය අවුරුදු අනූ දහසකි. නවදහසක් අවුරුදු ගිහි වාසය විය. ප්‍රාසාදයෙන්ම අභිනිෂ්ක්‍රමණය විය. උපස්ථායක රජු ජයසේනය. සෝතාරාමය නිත්‍ය වාසස්ථානය විය.

---

සෝභිත භාග්‍යවතුන් වහන්සේගෙන් පසු කල්ප අසංඛ්‍යයක් බුද්ධ ශූන්‍යව ගොස් එක් කල්පයක අනෝමදස්සි, පදුම, නාරද බුදුවරයන් වහන්සේලා තෙනමක් පහළ වූ බැවින් වරකල්පය නම්වේ.

## 7. අනෝමදස්සි බුද්ධ වංශය

සොළසාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පුරිත පාරමී ඇති අනෝමදස්සි බෝසතුන් චන්දවති නුවර යසවා රජුගේ යසෝධරා දේවිය කුස පිළිසිඳ සුනන්ද උයනේදී උපන්නේය. උපන් මොහොතේ දී අහසින් සත්රුවන් වැසි වැස්ස බැවින් අලාමක රුවන් ඉපදීමට හේතු වූයේය යන අර්ථයෙන් අනෝමදස්සි නම් විය. සිරි උපසිරි, සිරිවර්ධන යන තුන් පහයෙහි සිරිමා බිසව ප්‍රධාන විසිතුන්දහසක් ස්ත්‍රීන් සමග ගිහිව වැස සතර පෙරනිමිති දැක උපවාන පුත්‍රයා උපන් දින සිවිකාවෙන් අභිනිෂ්ක්‍රමණය කොට තුන් කෝටියක් දෙනා සමග පැවිදිව සපිරිවරින් දසමසක් දුෂ්කරක්‍රියා කොට පිරිසෙන් වෙන්ව වෙසක් පොහෝ ද අනූපම බමුණුගම පිඩුසිඟා වැඩ අනූපම සිටු දියණිය පිදූ මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ සල්වනයෙහි වැස සවස අනෝම ආජීවකයන් දුන් තෘණ අට මිට ගෙන කුඹුක් බෝධිය වෙත පැමිණ තෘණ අතුරා අටතිස් රියන් වජ්රාසනාරූඪව බුදුවූ සේක.

සත්සති ගෙවා බ්‍රහ්මාරාධනය පිළගෙන සුභාවතී නුවර සුදස්සන උයනට අහසින් වැඩ එක්ව පැවිදි වූ තුන්කෝටියක් දෙනාට දම්සක් දෙසීමෙන් කෝටිසියයක් දෙනා මගඵල ලැබූහ.

## ශ්‍රාවක සන්නිපාත

01 භික්ෂූහු අටලක්ෂයකි. 02 භික්ෂූහු සත්ලක්ෂයකි. 03 භික්ෂූහු සයලක්ෂයකි.

## සත්වන විවරණය ලැබීම.

එකල බෝසතාණෝ මහේශාක්‍ය යක්ෂ සේනාධිපතියෙක්ව මහත් ඍද්ධියානුභාවයෙන් කෝටිගණන් යක්ෂයන් පිරිවරා සිටිනාතුර බුදුන් ලොව පහලවූහ යි අසා සතුටුව බුදුන් වෙත පැමිණ සත්රුවන් මණ්ඩපයක් මවා බුද්ධ ප්‍රමුඛ සංඝයා වඩා හිඳුවා මහා දනයක් දුන්හ. අනුමෙවෙනි බණ වදරන තථගතයන් වහන්සේ මෙතෙමේ මෙයින් ඒකාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මතු බුදුවන්නේ යැයි විවරණ දුන්සේක.

අනෝමදස්සි බුදුන්ගේ උපන් නගරය චන්දවති නුවරය. යසවා රජු පියාය. යසෝධරා දේවිය මවය. නිසභ,අනෝම අග්‍රශ්‍රාවකයෝ වූහ. වරුණ උපස්ථායකය. සුන්දරී, සුමනා අග්‍රශ්‍රාවිකාවෝය. බෝධිය කුඹුක්ය. ශරීරය අටපණස් රියන්ය. ආයුෂය අවුරුදු ලක්ෂයකි. අගමෙහෙසිය සිරිමාය. උපවාන පුත්‍රයාය. දසදහසක් අවුරුදු ගිහි වාසය විය. අභිනිෂ්ක්‍රමණය සිවිකාවෙන් විය. ධම්මික රජු උපස්ථායකය. ධම්මාරාමය නිත්‍ය වාසස්ථානය විය.

---

## 9. <u>පදුම බුද්ධ වංශය</u>

සොළසාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමී ඇතිව පදුම බෝසතුන් එම කල්පයෙහිම දෙවන අන්තර් කල්පයෙහි ලක්ෂයක්

ආයු ඇතිවිට චම්පා නුවර අසම රජුගේ අසමා දේවිය කුස පිළිසිඳ චම්පක උයනේදි බිහිවූහ.
උපන් මොහොතේ මුහුදු ඉම් කෙළවර කොටැතිව දඹදිව පුරා පියුම් වැස්සක් වැසි බැවින් මහා පදුම යැයි නම් තැබූහ. උත්තර, වසුත්තර, යසුත්තර යන තුන් පහයෙහි උත්තරා දේවිය ප්‍රධාන තුන්දහසක් කන්‍යවන් සමග ගිහිව වාසය කර සතර පෙරනිමිති දැක රම්‍ය කුමරු උපන් දින ආජඤ්ඤ රථයෙන් අභිනිෂ්ක්‍රමණය කොට කෝටියක් දෙනා සමග පැවිදිව අටමසක් වීර්යය වඩා වෙසක් පොහෝද ධඤ්ඤවති නුවර සුධඤ්ඤ සිටුහුගේ ධඤ්ඤවතී සිටු දියණිය පිදූ මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ මී අඹ උයයෙහි වැස සවස තීර්ථක ආජීවකයන් දුන් තෘණ අටමිටිය ගෙන මහමුරුත (සෝන) බෝධිය වෙත පැමිණ තෘණ අතුරා අටතිස් රියන් වජිරාසනාරුඪව බුදුවූ සේක.

සත් සති ගෙවා බ්‍රහ්මාරාධනා ඇතිව ධඤ්ඤවති නුවර ධනඤ්ජය උයනට අහසින් වැඩ එක්ව පැවිදි වූ කෝටියක් භික්ෂූන්ට දම්සක් දෙසීමෙන් කෝටිසියයක් සත්වයන් නිවන් දුටුහ.

## ශ්‍රාවක සන්නිපාත

01 කෝටි ලක්ෂයක් භික්ෂුහු වූහ . 02 භික්ෂුහු තුන් ලක්ෂයකි. 03 භික්ෂුහු ලක්ෂ දෙකකි.

## අටවන විවරණය ලැබීම.

එකල බෝසතාණෝ සිංහරාජව ඉපිද සිට භාග්‍යවතුන් වහන්සේ ගෝසිංග සල් වනයෙහි වස් වැස නිරෝධ සමාපත්තියෙන් වැඩ සිටිනවා දැක පහන් සිතින් වැඳ පැදකුණු කොට හටගත් ප්‍රීති වේගයෙන් තෙවරක් සිංහ නාද පවත්වා ගොදුරු පිනිස

නොගොස් සතියක් බුදුරජාණන් වහන්සේ සමීපයෙහි බුද්ධාලම්භන ප්‍රීතියෙන් ජීවිත පූජාවෙන් සිටියේය.

නිරෝධ සමාපත්තියෙන් නැගී සිටි භාග්‍යවතුන් වහන්සේ සිංහයා බලා භක්ෂූන් කෙරෙහිද ඔහුගේ චිත්ත ප්‍රසාදය ඇතිකරවනු පිණිසද සිංහයාට අනුග්‍රහ පිනිසද භික්ෂූන් පැමිනෙත්වායි කළ අධිෂ්ඨානයෙන් වැඩියාවූ භික්ෂූන් බලා පහන් සිතින් පිනාගිය සිංහරාජයාහට මෙයින් ඒකාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකින් මතු බුදුවන්නේ යැයි විවරණ දුන්සේක.

පදුම භාග්‍යවතුන් වහන්සේගේ උපන්නගරය චම්පකය. අසම රජු පියාය. අසමා දේවිය මවය. සාල, උපසාල අග්‍රශ්‍රාවකයෝ වූහ. වරුණ උපස්ථායකය. රාධා සුරාධා අග්‍රශ්‍රාවිකාවෝය. මහාසෝණ බෝධියය. ශරීරය අටපණස් රියන් වූහ. ආයුෂය අවුරුදු ලක්‍ෂයකි. උත්තරා මහේශිකාව වූවාය. රම්‍ය කුමරු පුත්‍රයාය.

---

## <u>09 නාරද බුද්ධ වංශය.</u>

එම කපෙහි තුන්වන අතුරු කප අනූ දහසක් ආයු ඇතිවිට නාරද බෝසතුන් සාරාසංඛය්‍ය කල්ප ලක්‍ෂයක් පාරමී පුරා ධඤ්ඤවතී නුවර සුදේව ක්ෂත්‍රිය රජුගේ අනෝමා දේවිය කුසෙහි පිළිසිඳ ධනඤ්ජය උයනේදී උපන්නේය. උපන්මොහොතේ සියලු දඹදිව වැසියන්ට පරිභෝගයට ප්‍රමාණවත් ආභරණ අහසින්ද කල්ප වෘක්‍ෂයන් ගෙන්ද පහළ වූහ. එබැවින් මිනිසුන්ට සුදුසු ආභරණ දුන් බැවින් නාරද නම් විය.

විජිත, විජිතාවි, ජිතාභිරාම යන තුන් පහයෙහි එක් ලක්‍ෂ විසිදහසක් ස්ත්‍රීන්ට ප්‍රධාන වූ විජිතසේනා බිසව සමග අවුරුදු නවදහසක් වැස සතර පෙරනිමිති දැක නන්‍දුත්තර නම්

කුමරා උපන් දින චතුරාංගිනී සේනාව සමග පා ගමණින් අභිනිෂ්තක්‍රමණය කොට ලක්‍ෂයක් දෙන සමග පැවිදිව දුෂ්කරක්‍රියා කොට විජිතසේනා මහේශිකාව දුන් පායාසය වළදා එහිම වැස සවස සුදස්සන නම් උයන් පාලකයා දුන් තෘණ අට මිට ගෙන මහාසෝණ බෝධිය වෙත පැමිණ තෘණ අතුරා පැන නැගි අටපණස් ආසනයෙහි වැඩහිඳ බුදු වූ සේක.

සත්සති ගෙවා බ්‍රහ්මාරාධනයෙන් ධනඤ්ජය උයනේදී එක්ව පැවිදි වූ ලක්‍ෂයක් පිරිවරට දම්සක් දෙසීමෙන් කෝටි ලක්‍ෂයක් දෙවි මිනිසුන් මගඵල ලැබූහ.

## ශ්‍රාවක සන්නිපාත

01 කෝටි ලක්‍ෂයක් භික්‍ෂුහු වූහ . 02 භික්‍ෂූහු කෝටි අනූදහසකි. 03 භික්‍ෂූහු අසූදහසකි.

## නවවන විවරණය ලැබීම.

එකල බෝසතානෝ ඍසි පැවිද්දෙන් පැවිදිව හිමවත ආශ්‍රමයක් නගා එහි වසමින් පඤ්චාභිඥ අටසමවත් ලාභීව වසන කල්හි බෝසතුන් කෙරෙහි අනුකම්පා ඇති ශාස්තෲන් වහන්සේ අසූ කෝටියක් රහත් ගණයා පිරිවරා අනාගාමී උපාසකයන් දසදහසක් ද සමග ආශ්‍රමයට වැඩිසේක. බෝසතුන් බුදුන් දැක සතුටුව සපිරිවර බුදුන්ට වාසයට ආශ්‍රමයක් මවා වඩා හිඳුවා රාත්‍රියක් මුළුල්ලෙහි බුදුගුණ පවසා බණ අසා දෙවන දින උතුරුකුරු දිවයිනට පිඩු පිණිස ගොස් ප්‍රණීත පිණ්ඩපාත බොජුන් ගෙනවුත් පිරිවර සහිතව භාග්‍යවතුන් වහන්සේට සතියක් පුරා මහා දනයක් පූජාකොට හිමවතින් රත්හඳුන් ගෙනවුත් බුද්ධ ප්‍රමුඛ සංඝයාට පිදූහ.

භාග්‍යවතුන් වහන්සේ දෙවි මිනිසුන් පිරිවරා බණ වදරා මෙතෙමේ ඒකාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකින් මතු බුදුවන්නේ යැයි විවරණ දුන්සේක.

නාරද භාග්‍යවතුන් වහන්සේගේ නගරය ධඤ්ඤවතීය. සුදේව ක්ෂත්‍රිය රජු පියාය. මව අනෝමා දේවියය. භද්‍රසාල, ජිනමිත්‍ර අග්‍රශ්‍රාවකයෝ වූහ. වාසෙට්ඨ උපස්ථායකය. උත්තරා, ඵග්ගුනී අග්‍රශ්‍රාවිකාවෝය. බෝධි වෘක්ෂය මහාසෝණය. අටාසූරියන් ශරීරයය. ශරීර ප්‍රභාව යොදුනකි. අනූ ලක්ෂයක් අවුරුදු ආයුෂය විය. විජිතසේනා මහේශිකාවය. නන්දුත්තර පුත්‍රයාය. ශාසනය අවුරුදු අනූපන්දහසක් පැවිතියේය.

--------------------------

නාරද භාග්‍යවතුන් වහන්සේ පිරිනිවීමෙන් කල්ප අසංඛ්‍යයක් බුද්ධ ශුන්‍යව ගොස් සාර නම් කප පදුමුත්තර නම් බුදුන් පහළවූහ.

## 10 පදුමුත්තර බුද්ධ වංශය.

මිනිස්ලොව වර්ෂ ලක්ෂයක් ආයු ඇති කල සොළසාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමී ඇති පදුමුත්තර බෝසතුන් හංසවතී නුවර නන්දන රජුගේ සුජාතා මහේසිකාව කුස පිළිසිඳ හංසවතී උයනේදි උපන්නේය. උපන් මොහොතේදි පියුම් වැසි වට බැවින් පදුමුත්තර නම්විය. නරවාහන, යසවාහන, වසර්වතී යන මාලිගාවන්හි එක් ලක්ෂවිසිදහසක් ස්ත්‍රීන්ට ප්‍රධාන වූ වාසුදත්තා දේවිය සමග අවුරුදු දස දහසක් ගිහිව වැස සතර පෙරනිමිති දැක කලකිරී උත්තර කුමරු උපන්දින අභිනිෂ්ක්‍රමණයට සිතත්ම වසර්වතී නම් මාලිගය පිටින්ම අහස් ගතව ගොස් සලල බෝධිය මැදිකොට බිම පතිතව පිහිටියේය. එහිම සත්දිනක් විර්යය වඩා මාලිගයෙන් බැස උදේනි නියම්ගම රුචිනන්දා සිටු දියණිය දුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ සල්

වනයෙහි වැස හවස සුමිත්ත ආජීවකයන් දුන් තෘණ අට මිට ගෙන සලල බෝධිය වෙත පැමිණ තෘණ අතුරා තිස්අට රියන් වජ්රාසනාරූඪව බුදු වූ සේක.

ශාස්තෲන් වහන්සේ සත් දිනක් එම බෝධි පර්යඞ්කයෙහිම හිඳ නැගීසිටීමට සිතා දකුණු පාදය පොළවට දිගුකරනවාත් සමගම නෙලුම් මලක් පිපී පාදය පිලිගත්තේය. මෙලෙස පියවරක් පියවරක් පාසාම අවුරුදු අනූදහසක් ම නෙලුම් මල් වලින් තොරව පා නොතැබූ බැවින් ද පදුමුත්තර (පියමතුරා) නම් වූහ.

භාග්‍යවතුන් වහන්සේ සත්සති ගෙවා බ්‍රහ්මාරාධනයෙන් මිථිලා නුවරට අහසින් වැඩ පිරිවර සහිත දේවල සහ සුජාත කුමරුවන්ට දම්සක් දෙසීමෙන් කෝටි ලක්ෂයක් දෙනා මගඵල ලැබූහ.

## ශ්‍රාවක සන්නිපාත

01 කෝටි ලක්ෂයක් භික්ෂූහු වූහ . 02 කෝටි අනූදහසක් භික්ෂූහු වූහ . 03 කෝටි අසූදහසක් භික්ෂූහු වූහ.

## දසවන විවරණය ලැබීම.

එකල බෝසතාණෝ ජටිල නම් මහා රට්ව කෝටි ගණන් ධනය ඇතිව වසන්නේය. බුද්ධ ප්‍රමුඛ සංඝයාට චීවර සහිත දානයක් ද දුන්නේය. භුත්තානුමෝදනා කරන භාග්‍යවතුන් වහන්සේ මෙතෙමේ මෙයින් කල්ප ලක්ෂයකින් මතු බුදුවන්නේ යැයි විවරණ දුන්සේක.

පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ උපන් නගරය හංසවතීය. පියා ආනන්ද රජුය. මව සුජාතා දේවියය. දේවල, සුජාත අග්‍රශ්‍රාවකයෝ වූහ. සුමන උපස්ථායකය. අමිතා, අසමා අග්‍රශ්‍රාවිකාවෝය. සලල බෝධියය. අටපණස්රියන් ශරීරය විය. දොළොස් යොදුනක් ශරීර ප්‍රභාව විය. අවුරුදු ලක්ෂයක් ආයුශය

විය. වාසුදත්තා මහේශිකාව විය. උත්තර පුත්‍රයාය. නන්දරාමයෙහි පිරිනිවී සේක. ධාතුහු නොවිසිරුනහ. දිපවාසිහු දොළොස් යොදුන් සප්ත රත්නමය චෛත්‍යක ධාතු නිදන් කලේය.

---------------------------

පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේන් පසු කල්ප හැත්තෑ දහසක් බුදුවරු ලොව පහල නොවූහ. මේ කපට කල්ප තිස්දහසකට පෙර එක් කපෙක සුමේධ සුජාත බුදුවරයන් වහන්සේ දෙනම පහළ වූ බැවින් මණ්ඩ කල්පය නම්විය.

## 11. සුමේධ බුද්ධ වංශය

මිනිස් ආයුෂය අවුරුදු අනූදහසක් පැවති කල්හි අටාසංඛෙය්‍ය කල්පයක් පුරන ලද පාරමී ඇති සුමේධ බෝසතුන් සුදර්ශන රජුගේ සුදත්තා දේවිය කුස පිළිසිඳ සුදර්ශන උයනේදී උපන්නේය. සුචන්‍දක කොඤ්ච, සිරිවර්ධන යන තුන් පහයෙහි සුමනා දේවිය ප්‍රධාන සතලිස් අට දහසක් ස්ත්‍රීන් පිරිවර ඇතිව අවුරුදු නව දහසක් ගිහිව වැස සතර පෙරනිමිති දැක පුනබ්බසුමිත්ත කුමරු උපන්දින ඇත් යානයෙන් අභිනිෂ්ක්‍රමණය කොට කෝටි සියයක් දෙනා සමඟ පැවිදිව අටමසක් පධන් වීර්යය වඩා වෙසක් පෝද නකුල නියම්ගම නකුල සිටුදේවිය දුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ සල් වනයෙහි වැස සවස පිරිවර්ධන ආජීවකයන් දුන් තෘණ අටමිට ගෙන බක්මී බෝධිය වෙත පැමිණ තෘණ එලා විසිරියන් ආසනයෙහි වැඩ හිඳ බුදුවූ සේක.

සත්සති ගෙවා බ්‍රහ්මාරාධනයෙන් සුදශීන නුවර සමිපයෙහි වූ සුදශීන උයනට අහසින් වැඩ එක්ව පැවිදි වූ කෝටි සියයක්

දෙනාට දම්සක් දෙසීමෙන් කෝටි ලක්ෂයක් දෙනා මගඵල ලැබූහ.

## ශ්‍රාවක සන්නිපාත

01 කෝටි සියයක් භික්ෂූහු වූහ. 02 භික්ෂූහු අනූ කෝටියකි. 03 භික්ෂූහු කෝටි අසූවකි.

## එකොළොස්වන විවරණය ලැබීම.

බෝසතාණෝ සියලු ජනයාට උතුම් වූ උත්තර නම් මානවකව නිදන්කොට තැබූ අසූකෝටියක් ධනය වියදම් කොට බුද්ධ ප්‍රමුඛ සංඝයාට මහා දන් පූජාකොට බණ අසා තිසරණ සිල්හි පිහිටා සම්බුදු සසුනෙහි පැවිදි වූහ. භූත්තානුමෝදනා කරන භාග්‍යවතුන් වහන්සේ මෙයින් කල්ප තිස්දහසක් ගිය තැන මතු බුදුවන්නේ යැයි විවරණ දුන්සේක.

සුමේධ භාග්‍යවතුන් වහන්සේ උපන් නුවර සුදර්ශනය. සුදර්ශනය රජු පියාය. මව සුදත්තාය. සරණ, සබ්බකාමි අග්‍රශ්‍රාවකයෝ වූහ. සාගර උපස්ථායක වූහ. රාමා, සුරාමා අග්‍රශ්‍රාවිකාවෝ වූහ. මිදෙල්ල රුක බෝධියය. ශරීරය අටාසුරියන්ය. මහේශිකාව සුමනාය. පුනබ්බසුමිත්ත පුත්‍රයාය. ඇත් යානයෙන් අභිනිෂ්ක්‍රමණය විය. ශරීර ප්‍රභාවය යොදුනක් විය.

---------------------------

## 12 සුජාත බුද්ධවංශය.

එම කප ම දෙවන අතුරු කප ආයුෂ අනූදහසක් ව පැවති කල සුජාත බෝසතුන් අට අසංඛ්‍ය කල්පලක්ෂයක් පුරන ලද පාරමී ඇතිව සුමංගල නගරයෙහි උග්ගත රජුගේ පභාවතී මහේශිකාව කුස පිළිසිඳ දසමසක් ගිය කල උපන්නේය. සත්ත්වයන්ට සැප ගෙන දෙමින් උපන් බැවින් සුජාත නම් විය. සිරි, උපසිරි, නන්ද, යන තුන් පහයෙහි සිරිනන්ද දේවිය ප්‍රධාන විසිතුන්දහසක් ස්ත්‍රීන් පිරිවර ඇතිව අවුරුදු නවදහසක් ගිහිව වැස උපසේන පුතු උපන් දින පෙරනිමිති දැක සංවේගප්‍රාප්ත ව හන්සවහ අසු නැඟී අභිනිෂ්ක්‍රමණය කොට කෝටියක් දෙනා සමග පැවිදිව නවමසක් ප්‍රධන් වීරිය වඩා වෙසක් පොහෝ ද සිරිනන්දන නුවර සිරිනන්දන සිටුදුව දුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ සල් වනයෙහි වැස සවස සුනන්ද ආජීවක දුන් තෘණ අට මිට ගෙන උණ බෝධිය වෙත පැමිණ තෘණ අතුරා තිස්තුන් රියන් ආසනයෙහි වැඩහිඳ බුදු වූ සේක.

සත්සති ගෙවා දේවාරධනයෙන් සුමංගල නුවර සමීපයෙහි වූ සුමංගල උයනට අහසින් වැඩ සුදස්සන හා දේව කුමරුවන් ප්‍රධාන පිරිසට දම්සක් දෙසීමෙන් අසූ කොටියක් දෙනා මග ඵල නිවන් දැක්වූහ.

### ශ්‍රාවක සන්නිපාත.

1. භික්ෂූහු අසූ කොටියකි. 2. භික්ෂූහු තිස්හත්දහසකි. 3. භික්ෂූහු සැට ලක්ෂයකි.

### දොළොස්වෙනි විවරණය ලැබීම.

එකල බෝසතාණෝ සක්විති රජව ඉපිද බුදුරජාණන් වහන්සේ ලොව පහල වූහයි අසා සතුටුව ගොස් බණ අසා

සතරමහා දීපවාසීන් සමග එක්ව සප්තරත්න මය මණ්ඩපයක් කරවා මහා දන් දී සක්විති රාජ්‍යයද පූජා කළේය.

භාග්‍යවතුන් වහන්සේ මෙතෙමේ මෙයින් කල්ප තිස්දහසකින් මතු බුදුවන්නේ යැයි විවරණ දුන් සේක.

සුජාත බුදුන්ගේ නගරය සුමංගලය. උග්ගත රජු පියා ය. පභාවතී දේවිය මව ය. සුදස්සන, දේව අග්‍රශ්‍රාවක වූහ. නාරද උපස්ථායකය. නාගා, නාගසමාලා අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. උණ බෝධිය ය. ශරීරය පණස් රියන් ය. ආයුෂ අවුරුදු අනූ දහසකි. සිරිනන්ද අග්‍ර මහේශිකාව ය. උපසේන පුත්‍රයාය. චන්ද්‍රවතී නුවර සීලාරාමයේ දී පිරිණිවුනේය.

---

සුජාත භාග්‍යවතුන් වහන්සේ ගෙන් පසු කල්ප විසිනවදහස් අටසිය දෙඅසූවක් ඉක්ම ගිය කල්හී මේ කල්පයට එකසිය අටලොස්වන කල්පයෙහි පියදස්සී අත්ථදස්සී ධම්මදස්සී යැයි බුදුවරු තෙනමක් පහල වූ බැවින් වර කල්පය නම් වේ.

## 13 පියදස්සී බුද්ධවංශය

අටාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරන ලද පාරමී ඇතිව පියදස්සී බෝසතාණන් සුධඤ්ඤවතී නුවර සුදර්ශන රජුගේ චන්ද්‍රා නම් දේවිය කුස පිළිසිඳ වරුණ උයනේ දී උපන්නේ ය. උපන් මොහොතේ ලොවට ප්‍රිය පෙළහර විශේෂයක් දැක්වූ බැවින් පියදස්සී නම් විය. සුනිම්මල, විමලා, ගිරිබ්‍රහා නම් ප්‍රසාදයන් හී විමලා දේවිය ප්‍රධාන තිස්තුන්දහසක් කන්‍යාවන් පිරිවරා අවුරුදු නවදහසක් ගිහිව වැස කඤ්චන පුතු උපන් දින පෙරනිමිති දැක ආජඤ්ඤ රථයෙන් අභිනිෂ්ක්‍රමණය කොට කෝටියක් දෙනා සමග පැවිදිව සය මසක් ප්‍රධන් වීරිය වඩා වරුණ බමුණු ගම වසභ බ්‍රාහ්මණ තුමාගේ දියණිය පිදූ මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ

සල්වනයෙහි වැස සවස සුජාත ආජීවකයන් දුන් තෘණ අටමිට ගෙන කුමුක් බෝධිය වෙත පැමිණ තෘණ අටමිට අතුරා පණස් තුන්රියන් ආසනයෙහි හිඳ බුදු වූ සේක.

සත්සති ගෙවා දේවාරාධනයෙන් උසභවතී නුවර උසභ වනයට අහසින් වැඩ එක්ව පැවිදි වූ කෝටියක් දෙනාට දම්සක් දෙසීමෙන් කෝටිලක්ෂයක් දෙනා මගඵල නිවන් ලැබූහ.

**ශ්‍රාවක සන්නිපාත**

1. කොටිලක්ෂයක් භික්ෂූන් වූහ. 2. අනූ කොටියක් භික්ෂූන් වූහ. 3. අසූ කොටියක් භික්ෂූන් වූහ.

## තෙළෙස්වන විවරණය ලැබීම.

එකල බෝසතාණෝ ඉතිහාසය පස්වැනි වූ වේදයේ පාරප්‍රාප්ත බ්‍රාහ්මණ තරුණයෙක්ව ශාස්තෘන් වහන්සේගෙන් බණ අසා කෝටිලක්ෂයක් ධන වියදමින් ආවාසයක් ඉදිකරවා තිසරණ පන්සිල් හි පිහිටා බුද්ධප්‍රමුඛ සංඝයාට පූජා කළහ. එහි අනුසස් වදරමින් භාග්‍යවතුන්වහන්සේ මෙයින් එකසිය අටළොස් කපකින් මතු බුදුවන්නේ යැයි විවරණ දුන් සේක.

පියදස්සී භාග්‍යවතුන්වහන්සේ සුධඤ්ඤවතී නුවර උපන් සේක. සුදත්ත රජු පියාය. සුචන්ද්‍රා දේවිය මවය. පාලිත සබ්බදස්සී අග්‍ර ශ්‍රාවකයෝ වූහ. සෝභිත උපස්ථායක ය. සුජාතා , ධම්මදින්නා අග්‍ර ශ්‍රාවිකාවෝ ය. කකුධ(කුඹුක්) බෝධිය ය. ශරීරය අසූරියන් ය. ආයුෂය අවුරුදු අනූ දහසකි. මහේශිකාව විමලාය. කඤ්චනාවේල පුත්‍රයාය. ආජඤ්ඤ රථයෙන් අභිනිෂ්ක්‍රමණය විය.

-------------------------

## <u>14 අත්ථදස්සී බුද්ධ වංශය.</u>

එම කපම දෙවන අතුරුකප ලක්ෂයක් ආයුෂ ය පැවති කල සෝළසාසංඛ්‍යය කල්ප ලක්ෂයක් පිරූ පාරමී ඇතිව අත්ථදස්සී බෝසතුන් සෝභන නුවර සාගර රජුගේ සුදස්සනා දේවිය කුස පිළිසිඳ සුචින්ධන උයනේ දී බිහිවිය. උපන්ක්ෂණයෙහි බොහෝ කලක් සැඟවී ගිය කුල පරම්පරාගත මහාධන නිධන් නැවත පහළ වී හිමි වූ බැවින් අත්ථදස්සී යැයි නම් තැබීය. අමරග්ගී , සුරග්ගී, ගිරිවාහන යන තුන් පහයෙහි තිස්තුන් දහසක් ස්ත්‍රීන්ට ප්‍රධාන වූ විශාකා දේවිය සමඟ දසදහසක් අවුරුදු වැස සේල කුමරු උපන් දින පෙර නිමිති දැක සුදර්ශන ඇතුපිට නැගී අභිනිෂ්ක්‍රමණය කොට නව කෝටියක් දෙනා සමඟ පැවිදිව අටමසක් වීර්‍ය්‍ය වඩා සම්පූර්ණ ශරීරය ප්‍රදර්ශනය කරමින් සිටි සුචින්දර නාගිනියට පිදීමට මහා ජනයා ගෙන ආ රන් පාත්‍රය සමඟ මීපැණි මිශ්‍ර කිරිපිඩු පුදන ලදුව එය වළදා සල් වනයෙහි වැස සවස ධම්මරුචි නම් නා රජු දුන් තෘණ අටමිට ගෙන සපු බෝධිය වෙත පැමිණ තෘණ අතුරා තෙපණස් රියන් ආසනයෙහි වැඩහිඳ බුදු වූහ.

සත්සති ගෙවා දේවාරාධනයෙන් අනෝම උයනට අහසින් වැඩ එක්ව පැවිදි වූ නවකෝටියක් දෙනාට දම්සක් දෙසීමෙන් කෝටිලක්ෂයක් දෙනා මග ඵල ලැබූහ.

### ශ්‍රාවක සන්නිපාත

1 අනූ අටදහසක් භික්ෂූන් වූහ. 2. අසූ අටදහසක් භික්ෂූන් වූහ. 3. සැත්තෑ අටදහසක් භික්ෂූන් වූහ.

### තුදුස්වන විවරණය ලැබීම.

එකල බෝසතාණෝ චම්පක නුවර සුසීම නමින් ලෝක සම්මත මහාසාර බ්‍රාහ්මණ ව තම සියලු සම්පත් දුගීමගී යාචකාදීන්ට දන් දී හිමවතට ගොස් තවුස්ව පැවිදිව පඤ්චාභිඥා අෂ්ඨ සමාපත්ති ලබා මහත් ඍද්ධි ආනුභාව ඇතිව මහජනයාට

කුශලාකුශල ධර්මයන්ගේ නිරවද්‍ය සාවද්‍ය බව දක්වා බුද්ධෝත්පාදය බාලාපොරොත්තුවෙන් සිටියේය.

එකල අත්ථදස්සී භාග්‍යවතුන්වහන්සේ අට පිරිස් මැද සුදර්‍ශන මහ වෙහෙර ධර්‍ම දේශනා කරමින් වැඩසිටිනාතුර බෝසතුන් එහි පැමිණ බණ අසා දෙව්ලොව ගොස් පරසතු මදරා මල් ගෙනවුත් තම ආනුභාවය දක්වමින් සිව්දිග පුෂ්ප වර්ෂා වස්සවා පුෂ්ප මණ්ඩපයක් ඉදිකොට මදරා මල් කුඩයකින් භාග්‍යවතුන් වහන්සේ ට පූජා කළේය.අත්ථදස්සි භාග්‍යවතුන්වහන්සේ ද මෙතෙම මෙයින් අටළොස්කපකින් මතු බුදු වන්නේය යි විවරණ දුන් සේක.

අත්ථදස්සි භාග්‍යවතුන්වහන්සේගේ නගරය සොභන නුවරය. සාගර රජු පියාය. සුදස්සනා දේවිය මවය. සන්ත, උපසන්ත, අග්‍ර ශ්‍රාවකයෝ වූහ. අභය උපස්ථායකය. ධම්මා, සුධම්මා අග්‍ර ශ්‍රාවිකාවෝය. සපු බෝධිය ය. ශරීරය අසූරියන් ය. සැමකල්හි යොදුනක් ශරීරප්‍රභාව විය. ආයුෂය අවුරුදු ලක්ෂයකි. මහේශිකාව විශාකාවය. සේල පුත්‍රයාය. ඇත් යානයෙන් අභිෂ්ක්‍රමණය කළේය. ධාතූහු විසිරුණාහ.

------------------------

## 15 ධම්මදස්සී බුද්ධවංශය

එම කල්පයෙහි ම තෙවන අතුරුකප සොළසාසංඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමී ඇතිව මිනිස් ආයුෂය අවුරුදු ලක්ෂයක්ව පැවති කල සරණ නුවර සරණ රජුගේ සුනන්දා මෙහෙසිය කුස පිළිසිඳ සරණ උයනේදී වැසි කාලයෙහි උපන් සේක. මහා පුරුෂයන් වහන්සේ උපන් ක්ෂණයෙහි ම අධිකරණ ව්‍යවහාර පොත් හී අධාර්මික නීති ව්‍යවහාරාදිය ඉබේ ම අතුරුදහන් ව ධාර්මික නීති රීති ව්‍යවහාර පමණක් ඉතිරි විය. එබැවින් ධම්මදස්සී නම් වූහ. අරජ, විරජ, සුදස්සන තුන්

පහයන් හී විච්කෝලී දේවිය ප්‍රධාන වූ දහසකට අධික ස්ත්‍රීන් පිරිවර ඇතිව අවුරුදු අටදහසක් ගිහිව වැස සතරපෙරනිමිති දැක පුණ්‍යවර්ධන කුමරු උපන් දින රෑ මැදියම නැගිට නිදන ගැහැණුන්ගේ විප්‍රකාර දැක සංවේගයට පැමිණ අභිනිෂ්ක්‍රමණයට සිතුසේක. ඒ ක්ෂණයෙහිම සපිරිවරින් සුදර්ශනප්‍රාසාදය අහසට නැගී ගොස් රත් කරව් බෝධිය සමීපයෙහි බිමට බැස්සේ ය. බෝසතුන් බමුහු දූන් පිරිකර හැඳ පහයෙන් බැසසිටි කල්හී නැවත පහය අහසට ගොස් බෝධිය මැදිකොට බැසසිටීයේ ය. ස්ත්‍රීන් ද, සේවිකාවන් ද බැසගිය කල්හී එහි සිටි කෝටිලක්ෂයක් පුරුෂයෝ බෝසතුන් අනුව පැවිදි වූහ. සතියක් ප්‍රධන් වීයඃ වඩා බෝසත්හු විච්කෝලී දේවිය ගෙනදුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳා ඩෙබර වනයෙහි වැස සවස සිරිවඩ්ඪන ගවපාලකයා විසින් දෙනලද තෘණ අටමිට ගෙන රත් කරව් (බිම්බිජාල) බෝධිය වෙත පැමිණ තෘණ අතුරා තෙපණස් රියන් ආසනයෙහි වැඩහිඳ බුදු වූ සේක.

සත්සති ගෙවා දේවාරාධනයෙන් අටලොස් යොදුන් මග එක් දිනකින්ම ගෙවා ඉසිපතනයට වැඩ එක්ව පැවිදි වූ කෝටිලක්ෂයක් දෙනා ට දම් සක් දෙසීමෙන් සියල්ලෝ ම රහත්ඵල ලැබූහ.

## ශ්‍රාවක සන්නිපාත

1. භික්ෂූහු කෝටි දහසකි. 2. භික්ෂූහු කෝටි සීයකි. 3. භික්ෂූහු කෝටි අසූවකි.

## පසළොස්වන විවරණය ලැබීම

එකල්හී අප බෝසතාණෝ සක්‍රදේවේන්ද්‍රව ඉපිද සිටින්නාහු දෙදෙව් ලොව දෙවියන් පිරිවරා අවුත් දිව්‍යමය ගඳ මල් තුයඃ ආදියෙන් පූජා කළහ. භාග්‍යවතුන්වහන්සේ ඒ පිරිසට අනුශාසනා කොට මෙතෙම මෙයින් එකසිය අටළොස් කපකින් මතු බුදුවන්නේ යැයි විවණදුන් සේක.

ධම්මදස්සී භාග්‍යවතුන්වහන්සේගේ නගරය සරණ නම් විය. සරණ රජු පියාය. සුනන්ද දේවිය මව් ය. පදුම, ඵුස්සදේව අග්‍ර ශ්‍රාවකයෝ වූහ. සුනෙත්ත උපස්ථායකය. ඛේමා, සබ්බනාමා අග්‍ර ශ්‍රාවිකාවෝය. බිම්බිජාලා (රත් කරව්) වෘක්ෂය බෝධිය යි. ශරීරය අසූ රියන් ය. ආයුෂය අවුරුදු ලක්ෂයකි. අග්‍ර මහේශිකාව විචිකෝලී ය. පුණ්‍යවර්ධන පුත්‍රයාය. ප්‍රාසාදයෙන්ම අභිනිෂ්ක්‍රමණය විය. සාලවතී නුවර කශොරාමයේදී පිරිණිවන් පැ සේක.

---

එම වරකල්පය ගෙවීමෙන් පසු බුද්ධශූන්‍ය කල්ප විසි හතරක් ඉක්ම ගොස් මේ කල්පයට අනූ හතරවන සාර කල්පයෙහි සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේ ලොව පහල වූ සේක.

## 16 සිද්ධාර්ථ බුද්ධ වංශය.

අටාසංඛ්‍යකල්ප ලක්ෂයක් පුරන ලද පාරමී ඇති සිද්ධාර්ථ බෝසතුන් වේභාර නගරයෙහි උදේන රජුගේ සුඵස්සා අගමෙහෙසිය කුස පිළිසිඳ විරිය උයනේ දී උපන්නේය. උපන් මොහොතේ සියල්ලන්ගේ ම පටන්ගන්නා ලද කර්මාන්තයන් ද ප්‍රාර්ථනාකල සියල්ල ද සම්පූර්ණව ගිය බැවින් සිද්ධාර්ථ නම් විය. කොක, උප්පල, පදුම යන තුන් පහයන් හි සෝමනස්ස දේවිය ප්‍රධාන සතලිස් අටදහසක් කන්‍යාවන් පිරිවරා දසදහසක් අවුරුදු ගිහිව වැස පෙරනිමිති දැක අනූපම කුමරු උපන් ඇසල පොහෝ දින රන් සිවි ගෙයින් අභිනිස්ක්‍රමණය කොට විරිය උයනේ දී කෝටි ලක්ෂයක් දෙනා සමග පැවිදිව දස මසක් වීර්‍යයෙන් වඩා වෙසක් පොහෝ දින අසදිස බ්‍රාහ්මණ ගම සුනේත්‍රා බ්‍රාහ්මණයාගේ දියණිය දුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ ඩෙබර

වනයෙහි වැස සවස වරුණ නම් යව පාලකයා දුන් තෘණ අට මිට ගෙන කිණිහිරි බෝධිය වෙත පැමිණ තෘණ අතුරා සතලිස් රියන් ආසනයෙහි වැඩහිඳ බුදු වූ සේක.

සත්සති ගෙවා බ්‍රහ්මාරාධනය පිළිගෙන ගයා මිගදායට අහසින් වැඩ එක් ව පැවිදි වූ කෝටි ලක්ෂයක් දෙනාට දම්සක් දෙසීමෙන් සියල්ලෝම රහත් වූහ.

## <u>ශ්‍රාවක සන්නිපාත</u>

1 භික්ෂූහු කෝටි සියයකි 2 භික්ෂූහු කෝටි අනූදහසකි.3 භික්ෂූහු කෝටි අසූදහසකි.

**සොළොස්වන විවරණය ලැබීම.**

එකල බෝස්තාණෝ සූරසේන නගරයෙහි මංගල නම් බ්‍රාහ්මණව වේද වේදංගයන් හි පරතෙර පැමිණ මහත් වූ ධනස්බන්ධය දුගී මගී යාචකාදීන් ට පරිත්‍යාග කොට තවුස් පැවිද්දෙන් පැවිදි ව ධ්‍යාන අභිඥා වඩා වසන්නේ බුදුන් ලොව පහල වූහයි අසා සතුටුව ගොස් බණ අසා දඹ රුකක් නිසා දඹදිව යැයි ව්‍යවහාර කරන දඹ රුකින් දඹඵල ගෙනවුත් අනූකෝටියක් භික්ෂූන් පිරිවර ඇති භාග්‍යවතුන් වහන්සේ සූරසේන විහාරයෙහි වඩා හිඳුවා පූජාකළ සේක. ශාස්තෲන් වහන්සේ වළඳ අවසන්හි මෙයින් අනූ හතරකල්පයක් ගියතැන මෙතෙමේ බුදුවන්නේ යැයි විවරණ දුන් සේක.

සිද්ධාර්ථ භාග්‍යවතුන්වහන්සේ වේභාර නුවර දී උපන්නේ ය. උදේන ක්ෂත්‍රිය තෙමේ පියාය. සුඵස්සා දේවිය මවය. සම්බල, සුමිත්ත අග්‍ර ශ්‍රාවකයෝ වූහ. රේවත උපස්ථායක තෙරුන් ය. සීවලා, සුරාමා අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය කිණිහිරි වෘක්ෂය ය. ශරීරය සැට රියන් ය. ආයුෂය වර්ෂ ලක්ෂයකි. සොමනස්සා මහේශිකාවය. අනූපම පුත්‍රයාය. රන්සිවිගෙයින් අභිනිෂ්ක්‍රමණය විය. කඤ්චනවේළු නුවර අනෝම

උයනේ දී පිරිනිවි සේක. දඹ දිව වැසියන් එක්ව සතර යොදුන් රත්න මය චෛත්‍යයක ධාතූහු නිදන් කළහ.

---

සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගෙන් පසු එක් කල්පයක් බුද්ධ ශූන්‍ය ව ගොස් මෙයින් අනූ දෙවන මණ්ඩ කල්පයෙහි තිස්ස, ඵුස්ස බුදුවරයන් වහන්සේලා දෙනම පහළවූහ.

## 17. තිස්ස බුද්ධ වංශය.

අටාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමී ඇති තිස්ස බෝසතුන් ඛේම නම් නුවර සච්චසන්ධ රජුගේ පදුමා දේවිය කුස පිළිසිඳ අනෝම උයනේදී උපන්නේය. ගුහසේල, නාරිස, නිසභ යන තුන් පහහෙහි සුභද්‍රා දේවිය ප්‍රධාන තිස්තුන් දහසක් ස්ත්‍රීන් පිරිවරා සත්දහසක් අවුරුදු ගිහිව වැස සතර පෙරනිමිති දැක ආනන්ද කුමරු උපන් දින සොනුත්තර අසු පිටින් අභිනිෂ්ක්‍රමණය කොට කෝටියක් දෙනා සමග පැවිදි වූහ. අට මසක් වීයර්‍ය වඩා වෙසක් පොහෝ දින වීර නියම් ගම වීර සිටුවරයාගේ දියණිය දුන් මීපැණි මිශ්‍ර කිරිපිඩු වළඳා සල් වනයෙහි වැස සවස විජිත සංගාම යව පාලකයන් දුන් තෘණ අට මිට ගෙන පියා (මොර) බෝධිය වෙත පැමිණ තෘණ අතුරා හතළිස් රියන් ආසනයෙහි වැඩහිඳ බුදු වූ සේක.

සත් සති ගෙවා බ්‍රහ්මාරාධනයෙන් යශවතී නුවර සමීපයෙහි වූ මිගදායට අහසින් වැඩ හන්සවතී නුවර වැසි බ්‍රහ්මදේව සහ උදයන කුමරුවන් ප්‍රධාන පිරිසට දම්සක් දෙසීමෙන් කෝටිසියයක් දෙනා මග ඵල ලැබූහ.

**ශ්‍රාවක සන්නිපාත**

1 භික්ෂූහු ලක්ෂයකි. 2. භික්ෂූහු අනූලක්ෂයකි 3. භික්ෂූහු අසූ ලක්ෂයකි

**සතලොස්වන විවරණය ලැබීම.**

එකල බෝසතාණෝ යශවතී නුවර සුජාතනම් රජව සිට කෝටිගණන් වූ ධනය අත් හැර ජාත්‍යාදී දුක්ඛයන්හි කලකිරී තවුස් පැවිද්දෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ඨ සමාපත්ති ලාභීව මහත් සෘද්ධියානුභාවයෙන් වසන්නේ බුදුන් උපන්හයි අසා ප්‍රීතිමත්ව බුදුන් වෙත පැමිණ වැඳ සිතන්නේ **"මම දැන් පරසතු මදාරාදී දිව්‍යමය මල් ගවුවක් පමණ කරඬුවකින් දෙව්ලොවින් ගෙනවිත් භාග්‍යවතුන් වහන්සේට පුදන්නෙම් නම් යෙහෙකැයි"** දෙව් ලොව ගොස් සිතූ ලෙසින් මල් ගෙනවිත් පූජාකොට සිව්පිරිස් මැද අලංකාරවත් මල් කුඩයක් භාග්‍යවතුන් වහන්සේට දරමින් සිටියේය. එම පිරිස මධ්‍යයේ භාග්‍යවතුන්වහන්සේ මෙතෙම මෙයින් කල්ප අනූදෙකකින් මතු බුදුවන්නේ යැයි විවරණ දුන් සේක.

තිස්ස භාග්‍යවතුන්වහන්සේ ඛේම නගරයේදී උපන්නේය. ජනසන්ධ රජු පියාය. පදුමා දේවිය මවය. බ්‍රහ්මදේව, උදයන අග්‍ර ශ්‍රාවකයෝ වූහ. සම්භ තෙරුන් උපස්ථායකය. ඵුස්සා, සුදත්තා අග්‍රශ්‍රාවිකාවො ය. පියා වෘක්ෂය බෝධියය. ශරීරය සැටරියන් ය. ආයුෂය අවුරුදු ලක්ෂයකි. මහේශිකාව සුභද්‍රාය. ආනන්ද පුත්‍රයාය. අශ්වයානයෙන් අභිනිෂ්ක්‍රමණය විය. සුනන්දවතී නුවර සුනන්දරාමයේදි පිරිනිවි සේක.

---

## 18. ඵුස්ස බුද්ධ වංශය.

එම කල්පයෙහිම දෙවන අන්තරකල්පයෙහි සොළසාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමී ඇති ඵුස්ස බෝසතුන් කසී රට ජයසේන රජුගේ සිරිමා දේවිය කුස පිළිසිඳ

සිරිමා උයනේ දී උපන්නේ ය. ගරුළපක්ෂ, හංස, ස්වර්ණභාර තුන් පහයෙහි කිසාගෝතමිය ප්‍රධාන තිස්දහසක් ස්ත්‍රීන් පිරිවරා හයදහසක් අවුරුදු ගිහිව වැස පෙරනිමිති දැක අනුපම පුතු උපන් දින ඇතු පිටින් අභිනිෂ්ක්‍රමණය කොට කෝටියක් දෙනා සමග පැවිදි වූහ. හය මසක් ප්‍රධන් වීරිය වඩා පිරිස හැර එකලාව වෙසක් පොහෝ ද එක්තරා නුවරක සිරිවඩ්ඩණා නම් සිටු දියණියක් දුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ ඇට්ටේරිය වනයෙහි වැස සවස සිරිවර්ධන තාපස තුමා දුන් තෘණ අටමිට ගෙන නෙල්ලි (ආමලක) බෝධිය වෙත පැමිණ තෘණ අතුරා අටතිස් රියන් ආසනයෙහි වැඩහිඳ බුදුවූ සේක.

සත්සති ගෙවා බ්‍රහ්මාරධනා ඇතිව සංකස්ස නුවර ඉසිපතන මිගදායට අහසින් වැඩ එක්ව පැවිදි වූ කොටියක් දෙනාට  දම්සක් දෙසීමෙන් කෝටි ලක්ෂයක් දෙනා මග ඵල ලැබූහ.

## ශ්‍රාවක සන්නිපාත

1 භික්ෂූහු සැට ලක්ෂයකි. 2. භික්ෂූහු පනස් ලක්ෂයකි 3. භික්ෂූහු සතලිස් ලක්ෂයකි.

## අටළොස්වන විවරණය ලැබීම

එකල බෝසතාණෝ අරින්දම නුවර විජිතාවි රජව සිට බුදු බණ අසා පැහැද මහා දන් දී මහත් වූ ධනසම්පත් හා රාජ්‍යය හැර සම්බුදු සසුනෙහි පැවිදිව තුන්පිටකය ප්‍රගුණකොට ජනයාට ධර්මදේශනා කළහ. සීල පාරමිතාව ද පිරූහ. ඵුස්ස භාග්‍යවතුන්වහන්සේද මෙතෙම මෙයින් කල්ප අනූදෙකකින් මතු බුදුවන්නේ යැයි විවරණ දුන් සේක.

ඵුස්ස භාග්‍යවතුන්වහන්සේ කාසි නුවර උපන්නේය. ජයසේන රජු පියාය . සිරිමා බිසව මවය. සුරක්ඛිත, ධම්මසේන අග්‍ර ශ්‍රාවකයෝ වූහ. සභිය උපස්ථායකය. සාලා, උපසාලා අග්‍ර ශ්‍රාවිකාවෝය. නෙල්ලි වෘක්ෂය බෝධිය ය. ශරීරය

අටපණස් රියන් ය. ආයුෂය අවුරුදු අනූදහසකි. මහේශිකාව කිසාගෝතමියයි. අනූපම පුත්‍රයාය. ඇත් යානයෙන් අභිනිෂ්ක්‍රමණය විය. කුසිනාරා නුවර සෙතාරාමයේදී පිරිනිවි සේක. ධාතුහු විසිරුණහ.

---

ඵුස්ස භාග්‍යවතුන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු කල්පයවූ සාර කල්පයෙහි විපස්සී භාග්‍යවතුන්වහන්සේ ලොව පහල වූසේක

## 19. විපස්සි බුද්ධ වංශය

මිනිස් ආයුෂ අවුරුදු අසූ දහසක් වූ කල බන්ධුමතී නුවර බන්ධුම රජතුමාගේ බන්ධුමතී දේවිය කුස පිළිසිඳ ඛේම මිගදූයේ දී උපන්නේය. උපන් දිනයෙහි මවු පිය නෑයන්ට ද නුවරවැසියන්ට ද දිවා රෑ දෙක්හි විවෘතව ඔවුනොවුන් පෙනෙන්නට වූ බැවින් විපස්සි යැයි නම් තැබූහ. නන්ද, සුනන්ද, සිරිමා යන තුන්පහයෙහි සුදර්ශනා දේවිය ප්‍රධාන වූ එක්ලක්ෂ විසිදහසක් කන්‍යාවන් සමඟ අවුරුදු අටදහසක් ගිහිව වැස සතරපෙරනිමිති දැක සමවත්තක්ඛන්ධ පුත්‍රයා උපන් දින ආජඤ්ඤ රථයෙන් අභිනිෂ්ක්‍රමණය කොට අසූහාරදහසක් දෙනා සමඟ පැවිදි ව අටමසක් ප්‍රධන් වීර්‍යය වඩා වෙසක් පොහෝ දින සුදර්ශනා සිටු දියණිය දුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ මලින් ගැවසුනු සල් වනයෙහි වැස සවස සුජාත නම් යව පාලකයන් දුන් තෘණ අටමිට ගෙන පළොල් බෝධිය වෙත පැමිණ තෘණ අතුරා තෙපණස් රියන් ආසනයෙහි වැඩහිඳ බුදු වූ සේක.

සත්සති ගෙවා බ්‍රහ්මාරාධනා ඇතිව ඛේම මිගදායට අහසින් වැඩ ඛණ්ඩ හා තිස්ස කුමාරවරුන් ප්‍රධාන පිරිසට දම්සක් දෙසීමෙන් අප්‍රමාණ දෙව්මිනිසුන් නිවන් දුටහ.

## ශ්‍රාවක සන්නිපාත

1 භික්ෂූහු අටසැට ලක්ෂයකි. 2. භික්ෂූහු ලක්ෂයකි 3. භික්ෂූහු අසූ දහසකි.

## එකුන්විසිවන විවරණය ලැබීම.

එකල බෝසතාණෝ මහත් සෘද්ධියානුභාව ඇති අතුල නම් නා රජව සිට කෝටි ගනන් නා පිරිවර ඇතිව අවුත් රත්නමය මණ්ඩපයක් මවා දිව්‍යමය ආහාරපානයෙන් බුද්ධප්‍රමුඛ සංඝයා පුදා සප්ත රත්නමය පීඨයක් භාග්‍යවතුන්වහන්සේට පූජාකළේය. එහි අනුසස් වදාරණ භාග්‍යවතුන්වහන්සේ මෙයින් එක් අනූකපකින් මතු මෙතෙම බුදුවන්නේ යැයි විවරණ දුන් සේක.

විපස්සී භාග්‍යවතුන්වහන්සේ උපන් නගරය බන්ධුමතී නම්. බන්ධුම රජු පියාය. බන්ධුමතී දේවිය මවය. ඛණ්ඩ,තිස්ස අග්‍ර ශ්‍රාවකයෝ වූහ. අශෝක තෙරුන් උපස්ථායක විය. චන්ද චන්දමිත්තා අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. පළොල් වෘක්ෂය බෝධිය ය. ශරීරය අසූ රියන්ය. ශරීරප්‍රභාව යොදුන් සතකි. අවුරුදු අසූ දහසක් ආයුෂ විය. සුනන්දා මහේශිකාවය. පුත්‍රයා සමවත්තක්ඛන්ධය. ආජඤ්ඤ රථයෙන් අභිනිෂ්ක්‍රමණය විය.

---

විපස්සී භාග්‍යවතුන්වහන්සේගෙන් පසු පනස්නව කපක් බුද්ධ ශූන්‍යව ගෙවී ගොස් මෙයින් එක් තිස්වන මණ්ඩ

කල්පයෙහි සිඛී, වෙස්සභූ බුදුවරයන් දෙනම වහන්සේ ලොව පහළ වූහ.

## 20. සිඛී බුද්ධ වංශය

සිඛී බෝසතුන් අරුණවතී නුවර අරුණවතී රජුගේ පභාවතී දේවිය කුස පිළිසිඳ නිපක උයනේ දී උපන්නේය. ශිඛාවක්(සිළුව) මෙන් නළල උඩ නැගී බැවින් සිඛී නම් විය. සුචන්දක, සිරියස, නාරිවසභ ප්‍රාසාදත්‍රයෙහි සබ්බකාමා දේවිය ප්‍රධාන විසිදහසක් ස්ත්‍රීන් පිරිවරා සත්දහසක් අවුරුදු ගිහිව වැස පෙරනිමිති දැක අතුලනම් පුතු උපන් දින ඇත් යානයෙන් අභිනිෂ්ක්‍රමණය කොට සැත්තෑලක්ෂයක් සමඟ පැවිදිව අට මසක් ප්‍රධන් වීර්‍ය්‍යී වඩා වෙසක් පොහෝ දින සුදර්ශන නියම් ගම පියදස්සී සිටුහුගේ දියණිය දුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳා කිහිරි වනයෙහි වැස සවස අනෝමදස්සී තාපසයන් දුන් තෘණ අට මිට ගෙන ඇටඹ බෝධිය වෙත පැමිණ තෘණ අතුරා සිව් විසි රියන් ආසනයෙහි වැඩහිඳ බුදු වූ සේක.

සත් සති ගෙවා බ්‍රහ්මාරාධනය පිළිගෙන අරුණවතී නුවර සමීපයෙහි වූ මිගාචීර උයනට අහසින් වැඩ එක්ව පැවිදි වූ සැත්තෑ ලක්ෂයක් දෙනාට දම්සක් දෙසීමෙන් කෝටි ලක්ෂයක් දෙනා මඟ ඵල නිවන් දුටහ.

### ශ්‍රාවක සන්නිපාත

1 භික්ෂූහු ලක්ෂයකි. 3. භික්ෂූහු අසූ දහසකි. 2. භික්ෂූහු සැත්තෑ දහසකි.

### විසිවන විවරණ ලැබීම

එකල බෝසතාණෝ පරිභුත්ත නුවර අරින්දම නම් රජව සිට කිසි තැනකත් නොඇලුනු සිතින් වසන්නේ භාග්‍යවතුන් වහන්සේ පරිභුත්ත නුවරට වැඩි කල්හි සපරිවරින් පෙරගමන්

ගොස් ආරාධනා කොට මහත් ශ්‍රද්ධාවෙන් මහා දන් දී සළු ගබඩා ඇර මහගු සළු පූජාකොට ඇතෙක් බරට කැපවස්තූන් දන් දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙතෙම මෙයින් එක් තිස්වන කප බුදුවන්නේ යැයි විවරණ දුන් සේක.

සිඛී භාග්‍යවතුන් වහන්සේ උපන් නගරය අරුණවතී ය. අරුණවතී රජ පියාය. පභාවතී දේවිය මවය. අභිභූ, සම්භව අග්‍ර ශ්‍රාවක වූහ. ඛේමංකර උපස්ථායකය. මඛිලා, පදුමා අග්‍ර ශ්‍රාවිකාවෝය. ඇටඹ වෘක්ෂය බෝධිය ය. ශරීරය සැත්තෑ රියන් ය. ශරීරප්‍රභාව තුන් යොදුනකි. ආයුෂය අවුරුදු සැත්තෑදහසකි. සබ්බකාමා මහේශිකාවය. අතුල පුත්‍රයාය. සීලවතී නුවර අශෝකාරාමයේ දී පිරිනිවී සේක. ධාතුහු නොවිසිරුණහ. සකල දඹදිව් වැසියෝ එක්ව ධාතු නිධාන කොට සප්ත රත්න මය තුන් යොදුන් සෑයක් කළහ.

---

## 21. වෙස්සභූ බුද්ධවංශය

එම කපම දෙවන අතුරුකප අනූපම නුවර සුප්‍රතීත රජුගේ යසවතී දේවිය කුස පිළිසිඳ අනූපම උයනේ දී උපන්නේ ය. උපන් මොහොතේ ජනයා සතුටු කරවමින් වෘෂභ නාද පැවති බැවින් වෙස්සභූ නම් විය. සුචි, සුරුචි, රතිවර්ධන තුන් පහයෙහි සුචිත්‍රා දේවිය ප්‍රමුඛ තිස්දහසක් ස්ත්‍රීන් පිරිවරා අවුරුදු හයදහසක් ගිහිව වැස පෙරනිමිති දැක සුප්පබුද්ධ කුමරු උපන් දින රන් සිවි ගෙයින් අභිනිෂ්ක්‍රමණය කොට සැත්තෑදහසක් දෙනා සමඟ පැවිදිව සය මසක් වියෑ වඩා වෙසක් පොහෝ දින සුචිත්ත නියම් ගම සිරිවර්ධනා කුමරිය දුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳා සල් වනයෙහි වැස සවස නරින්ද නා රජුන් දුන් තෘණ අට මිට ගෙන සල් බෝධිය වෙත පැමිණ තෘණ අතුරා සතළිස් රියන් ආසනයෙහි වැඩහිඳ බුදු වූ සේක.

සත්සති ගෙවා බ්‍රහ්මාරාධනය පිළිගෙන අනුපම නුවර සමීපයෙහි වූ අරුණ උයනට අහසින් වැඩ සෝණ, උත්තර කුමාරවරුන් ප්‍රධාන පිරිසට දම්සක් දෙසීමෙන් කොටි අසූදහසක් දෙනාට ධර්මාවබෝධය වූහ.

<u>ශ්‍රාවක සන්නිපාත</u>

1 භික්ෂුහු අසූ දහසකි 2.භික්ෂුහු සත් තිස්දහසකි. 3.. භික්ෂුහු සැට දහසකි.

## එක්විසිවන විවරණය ලැබීම

එකල බෝසතාණෝ සරභවතී නුවර සුදර්ශන නම් රජව සිට ලෝකනායකයන් වහන්සේ එනුවරට වැඩි කල්හී බණ අසා පැහැද බුද්ධප්‍රමුඛ සංඝයාට මහත් චීවරපූජාවක් කොට එහි ම ගඳකිළියක් සාද එය වටකොට විහාර දහසක් සාදවා සියළු ධන සම්පත් සසුනට පූජාකොට පැවිදිව ආචාර ගුණ සම්පන්නව තෙලෙස් ධුතාංග ධරව බෝධි සම්භාර පිරීමෙහි ඇලී විසූහ. එකල්හි භාග්‍යවතුන්වහන්සේ මෙතෙම මෙයින් එක් තිස් වන කප බුදුවන්නේ යැයි විවරණ දුන් සේක.

වෙස්සභූ භාග්‍යවතුන්වහන්සේ උපන් නගරය අනුපම නම්. සුප්‍රතික ක්ෂත්‍රිය රජු පියාය. යසවතී දේවීය මවය. සොණ, උත්තර අග්‍ර ශ්‍රාවකයෝ වූහ. උපසන්ත තෙරුන් උපස්ථායකය. දමා, සමාලා අග්‍ර ශ්‍රාවිකාවෝ ය. සාලබෝධියය. ශරීරය සැට රියන් ය. ආයුෂය අවුරුදු සැටදහසකි. සුමිත්‍රා අග මෙහෙසිය ය. පුත්‍රයා සුප්පබුද්ධ ය. රන් සිවි ගෙයින් අභිනිෂ්ක්‍රමණය විය. උසභවතී නුවර ඛේම මිගදායෙහි පිරිනිවි සේක. ධාතූහු විසිරුණහ.

වෙස්සභූ භාග්‍යවතුන්වහන්සේගේ පරිනිර්වානයෙන් පසු කල්ප විසිනවයක් බුද්ධ ශූන්‍යව ගොස් බුදුරජාණන් වහන්සේලා පස්නමක් පහළවන බැවින් මෙම කල්පය මහා භද්‍ර කල්පය නම් වන්නේය. කකුසඳ, කොණාගමන, කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේලා පූර්වයෙහි පහළ වූහ. මේ වනාහි ගෞතම

බුද්ධ ශාසනයයි. අනාගත කාලයෙහි මෛත්‍රී භාග්‍යවතුන්වහන්සේ ලොව පහළ වන්නාහ.

## 22. කකුසඳ බුද්ධ වංශය.

පුරන ලද පාරමී ඇති කකුසඳ බෝසතුන් ඛේමවතී නුවර ඛේමංකර රජුගේ රාජ්‍යයෙහි අග්ගිදත්ත පුරෝහිත තුමාගේ බැමිණිය වන විශාඛා මහේශිකාවගේ කුස පිළිසිඳ ඛේම උයනේදී උපන්නේය. සුචි, සුරුචි, රතිවර්ධන යන තුන්පහයෙහි රෝහිණී මහේශිකාව ප්‍රමුඛ තිස් දහසක් ස්ත්‍රීන් පිරිවරා අවුරුදු හාරදහසක් ගිහිව වැස සතරපෙරනිමිති දැක උත්තර කුමරු උපන් දින ආජඤ්ඤ රථයෙන් අභිනිෂ්ක්‍රමණය කොට සතළිස්දහසක් දෙනා සමග පැවිදි වූහ. අටමසක් ප්‍රධන් වීර්‍ය්‍ය වඩා වෙසක් පොහොය දින සුචිරින්ද නියම් ගම වජිරින්ධ බ්‍රාහ්මණ දියණිය දුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ කිහිරි වනයේ වැස සවස සුභද්‍ර යවපාලකයන් දුන් තෘණ අට මිට ගෙන මහරි බෝධිය වෙත පැමිණ තෘණ අතුරා තිස් සතර රියන් ආසනයෙහි වැඩහිඳ බුදු වූ සේක.

සත්සති ගෙවා බ්‍රහ්මාරාධනා ඇතිව මඛිල නුවර සමීපයෙහි වූ සම්භූත ඉසිපතනයට එකලාව වැඩ එක්ව පැවිදි වූ සතළිස් දහසක් දෙනාට දම් සක් දෙසීමෙන් කෝටිසතළිස්දහසක් දෙනා මඟ ඵල ලැබූහ.

### ශ්‍රාවක සන්නිපාත

එම ශාසනයෙහි එකම ශ්‍රාවක සන්නිපාතයකි.

1 භික්ෂූහු හතළිස් දහසකි.

### දෙවිසිවන විවරණය ලැබීම.

එකල බෝසතාණෝ ඛේම නුවර ඛේම නම් රජව සිටින්නේ බුද්ධප්‍රමුඛ සංඝයාට පාත්‍ර චීවර සමග මහ දන් දී

අඳුන් ආදී වූ සියළු බෙහෙත් වර්‍ග දන් දුන්හ. අනෙකුදු පරිෂ්කාරයන් ද පූජා කොට බණ අසා බුදුසසුනෙහි පැවිදි වූහ. කකුසඳ භාග්‍යවතුන්වහන්සේ ද මෙතෙම මෙකපම සතරවන අතුරු කප බුදුන්තේ යැයි විවරණ දුන් සේක.

කකුසඳ භාග්‍යවතුන්වහන්සේ උපන් නගරය ඛේමවතී නම්. අග්ගිදත්ත බ්‍රාහ්මණ තෙමේ පියා ය. විශාඛා බැමිණිය මවය. විධුර, සංජීව දෙනම අග්‍ර ශ්‍රාවක වූහ. බුද්ධිජ තෙරුන් උපස්ථායක ය. සාමා, චම්පා අග්‍ර ශ්‍රාවිකාවෝ ය. මහාරි බෝධිය ය. ශරීරය සතළිස් රියන් ය. ශරීරාලෝකය හාත්පස දස යොදුනෙකි. ආයුෂය අවුරුදු සතළිස් දහසකි. රෝචිනී භාර්යාවය. උත්තර පුත්‍රයාය. රථයෙන් අභිනිෂ්ක්‍රමණය විය. ඛේම මිගදය නිත්‍ය වාසස්ථානය විය.

---

## 23.කොණාගමණ බුද්ධ වංශය

මෙම කපෙහි ම දෙවන අතුරු කප සෝභවතී නුවර යඤ්ඤදත්ත බමුණුතුමාගේ උත්තරා බැමිණිය කුස පිළිසිඳ සුභගවතී උයනේ දී උපන්නේ ය. උපන් මොහෝතේදී මුළු දඹදිව් තලයට රන් වර්‍ෂා වට බැවින් කොණාගමන නම් විය. තුෂිත, සන්තුෂිත, සන්තුෂ්ටි නම් තුන් පහයෙහි රුචිගත්තා වරගන ප්‍රධාන සොළොස්දහසක් පරිවාර ස්ත්‍රීන් සමඟ අවුරුදු තුන්දහසක් ගිහිව වැස සතර පෙරනිමිති දැක සාර්ථවාහ කුමරු උපන් දින ඇත් යානයෙන් අභිනිෂ්ක්‍රමණය කොට තිස්දහසක් දෙනා සමඟ පැවිදි වූහ. සය මසක් ප්‍රධන්වීර්‍ය්‍ය වඩා වෙසක් පොහෝ දින අග්ගි සෝණ බ්‍රාහ්මණතුමාගේ දියණිය දුන් මීපැණි මිශ්‍ර කිරිපිඩු වළඳ කිහිරි වනයේ වැස සවස තින්දුක යවපාලයන් දුන් තෘණ අට මිට ගෙන දිඹුල් බෝධිය වෙත

පැමිණ තෘණ අතුරා විසි රියන් ආසනයෙහි වැඩහිඳ බුදු වූ සේක.

සත් සති ගෙවා බ්‍රහ්මාරධනාව පිළිගෙන සුදර්‍ශන නුවර සමීපයෙහි ඉසිපතනයට අහසින් වැඩ එක්ව පැවිදි වූ තිස් දහසක් දෙනාට දම්සක් දෙසීමෙන් කෝටි තිස්දහසක් දෙනා මග ඵල ලැබූහ.

## ශ්‍රාවක සන්නිපාත

එම ශාසනයෙහි එකම ශ්‍රාවක සන්නිපාතයකි.

1 භික්ෂූහු තිස් දහසකි.

## තෙවිසිවන විවරණ ලැබීම

එකල බෝසතාණෝ මිථිලා නුවර පර්‍වත නම් රජව සිටි කල්හි සරණාගත සියළු ප්‍රාණීන්ගේ ආගමන ඇති කෝණාගමන භාග්‍යවතුන්වහන්සේ මිථිලා නුවරට වැඩිසේක. ඒ ඇසූ බෝසතාණෝ සතුටුව සපරිවරින් පෙරගමන් කොට දන් දී බුද්ධප්‍රමුඛ සංඝයාට ආරාධනා කොට වස් වස්වා තෙමසක් මුළුල්ලෙහි උපස්ථාන කොට සියුම් සළු මිරිවැඩිසඟල් ද නොයෙක් පිරිකර ද පූජා කළහ. කෝණාගමන භාග්‍යවතුන්වහන්සේ ද මෙතෙම මෙකපම සතරවන අතුරු කප බුදුන්නේ යැයි විවරණ දුන් සේක.

කොණාගමණ බුදුරජාණන් වහන්සේ උපන් නගරය සෝභවතී නම්ය. යඤ්ඤදත්ත බ්‍රාහ්මණ තෙමේ පියා ය. උත්තරා බැමිණිය මවය. භීයස, උත්තර දෙනම අග්‍ර ශ්‍රාවකයෝ වූහ. සොත්ථිය තෙරුන් උපස්ථායකය. සමුද්‍රා උත්තරා අග්‍ර ශ්‍රාවිකාවෝ ය. උදුම්බර වෘක්ෂය බෝධිය විය. ශරීරය තිස්රියන් විය. ආයුෂය අවුරුදු තිස්දහසකි. බිසව රුචිගත්තා නම්. සාර්ථවාහ පුත්‍රයාය. අභිනිෂ්ක්‍රමණය ඇත් යාණයෙන් විය. සිරිවනය නිත්‍ය වාසස්ථානය විය.

## 24.කාශ්‍යප බුද්ධ වංශය

මෙම කප තෙවන අන්තර් කල්පයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත බ්‍රාහ්මණ තුමාගේ ධනවතී බැමිණිය කුස පිළිසිඳ ඉසිපතන මිගදායේදී උපන්නේය. කාශ්‍යප ගෝත්‍රයෙහි උපන් බැවින් කාශ්‍යප නම් විය. හංසවා, යසවා, සිරිනන්ද තුන් පහයෙහි සුනන්ද මෙහෙසිය ප්‍රධාන හතලිස් අටදහසක් ස්ත්‍රීන් සමග අවුරුදු දෙදහසක් ගිහිව වැස සතර පෙරනිමිති දැක විජිතසේන පුත්‍රයා උපන්දින අභිනිෂ්ක්‍රමණයට සිතත්ම ප්‍රසාදය කුඹල් සකක් මෙන් පිරිවර සහිතව අහසින් ගොස් නුග බෝධිය මැදි කොට බිම පිහිටියේය. බෝසතුන් පහයෙන් බැස බ්‍රහ්මයෙකු ගෙනවිත් පිදූ අටපිරිකර හැද පෙරව පැවිදි විය. ස්ත්‍රීහු පහයෙන් බැස පිටත්ව ගිය කල්හි සියලු පුරුෂයෝ බෝසතුන් අනුව පැවිදි වූහ. සත් දිනක් ප්‍රධන් විර්යය වඩා පිරිසෙන් වෙන්ව වෙසක් පෝද සුනන්ද මහේසිකාව දුන් මිපැණි මිශ්‍ර කිරිපිඩු වළදා කිහිරි වනයෙහි වැස හවස සෝම නම් ගොපල්ලා දුන් තෘණ අට මිට ගෙන නුග බෝධිය වෙත පැමිණ තෘණ අතුරා පසළොස් රියන් ආසනයෙහි වැඩ හිඳ බුදු වූ සේක.

සත්සති ගෙවා බ්‍රහ්මාරාධනයෙන් බරණැස ඉසිපතණයට අහසින් වැඩ එක්ව පැවිදි වූ කෝටියක් භික්ෂූන්ට දම්සක් දෙසීමෙන් කෝටි විසිදහසක් දෙනා මග එල ලැබූහ.

### ශ්‍රාවක සන්නිපාත

එම ශාසනයෙහි එකම ශ්‍රාවක සන්නිපාතයකි.

1. භික්ෂූහු විසි දහසකි.

### සූවිසි වන විවරණය ලැබීම.

එකල්හි බෝසතාණෝ බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද ජෝතිපාල මානවක යන නමින් ප්‍රසිද්ධව ත්‍රිවේද ප්‍රාප්තව සිට කුම්භකාර කුලයෙහි උපන් ඝටීකාර නම් මිත්‍රයාගේ මග පෙන්වීමෙන් බුදුන් වෙත ගොස් දහම් කථා අසා පැහැද සියලු සම්පත් අත්හැර පැවිදිව ත්‍රිපිටකධාරීව මනා වත්පිළිවෙතින් බුදු සසුන හෙබවූහ. භාග්‍යවතුන් වහන්සේ මෙතෙම ඊළඟ අන්තර් කල්පයෙහි බුදුවන්නේ යැයි විවරණ දුන්සේක.

කාශ්‍යප බුදුන්ගේ නගරය බරණැස් නුවරය. බ්‍රහ්මදත්ත රජතෙමේ පියාය. ධනවති බැමිණිය මවය. තිස්ස, භාරද්වාජ අග්‍රශ්‍රාවකයෝ වූහ. උපස්ථායක සබ්බමිත්තය. අනුලා, උරුවෙලා අග්‍රශ්‍රාවිකාවෝය. නුග බෝධියය. ශරීරය විසිරියන්ය. ආයුෂය අවුරුදු විසි දහසකි. මහේශිකාව නන්දාය. විජිතසේන පුත්‍රයාය. ප්‍රාසාදයෙන්ම අබිනිෂ්ක්‍රමණය විය. කසිරට සේතව්‍ය උයනේදී පිරිනිවී සේක. ධාතුහු නොවිසුරුනහ. සියලු දඹදිව වැසියන් එක්ව ඒක ඝන වූ ධාතුහු යොදුනක් උස රන් සෑයක තැම්පත් කළහ.

-------------------------

සාධු! සාධු! සාධු!

# ධර්ම දානය

සුදත් අන්නාසිවත්ත මහතා ධර්ම ග්‍රන්ථ 1000ක දායකත්වය

රන්ජන් වල්පොල මහතා ධර්ම ග්‍රන්ථ 600ක දායකත්වය

ඉන්ද්‍රජිත් මහතා ධර්ම ග්‍රන්ථ 300ක දායකත්වය

නුවරඑළියේ ධම්මිකා සිල් මෑණියෝ ඇතුළු දායක පිරිස
ධර්ම ග්‍රන්ථ 200ක දායකත්වය

මෙම "ශ්‍රීමත් සිද්ධාර්ථ ගෞතම බෝධි සත්ත්ව විවරණ සහිත සූවිසි බුද්ධ වංශය" ධර්ම ග්‍රන්ථ දානමය කුසලානිසංසය, මේ පිංකම සඳහා දායක වූ සියලුම පිංවතුන් ඇතුළු ඔවුන්ගේ සියලුම ඥාති හිතමිත්‍රාදීන්ගේත් සියළු සම්‍යක් ප්‍රාර්ථනා ඉෂ්ට සිද්ධව ගන්න හෙලන හුස්ම රැල්ලක් පාසාම අලෝභ, අදෝස, අමෝහ සිත් පෙරදැරිව සුවසේම පාරමීදම් පුරා අමා මහ නිවනින් සැනසීම පිණිසම ඒකාන්තයෙන් හේතු වේවා. මිය ගිය ඥාති සමූහයාගේ ද නිවන් මග ඒකාලෝකවීම පිණිසම මෙම කුසලය ඒකාන්තයෙන් හේතු වේවා !

අරියමග්ග සංවිධානය
2012.04.21

අරියමග්ග සංවිධානය
නො. 29, දෙවන වැපල් පටුමග
කොළඹ 06

Tel : 071 4242295 , 071 4823989
Email : ariyamaga@yahoo.com
Web : www.ariyamagga.org